# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
# WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 ජනවාරි 08 වන අඟහරුවාදා**
2013 ஜனவரி 08 செவ்வாய்க்கிழமை
Tuesday 08th January 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.51 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.51 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.51 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා.

එසේම ලැබුවා වූ 2013 නව වසර සුභ නව වසරක් වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. අදට නියමිත න්‍යාය පත්‍රය අනුව,

## නිවේදන
## ANNOUNCEMENTS

**ගරු ආණ්ඩුකාරවරයාගේ අනුඥාව ලැබීම**
OBTAINING GOVERNOR'S ASSENT

*i*

*"2012 අගෝස්තු මස 07 වන දින සභා සම්මත වූ බස්නාහිර පළාතේ 2012 අංක 04 දරණ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2012 දෙසැම්බර් මස 13 වන දින අනුඥාව ලබාදී ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"2012 දෙසැම්බර් මස 10 වන දින සභා සම්මත වූ 2013 ජනවාරි මස 01 වන දින සිට 2013 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ මුදල් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රකාශයට අදාළ 2012 අංක 06 දරණ විසර්ජන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2012 දෙසැම්බර් මස 13වන දින අනුඥාව ලබා දී ඇති බව කාරුණිකව දැනුම් දෙනවා. "*

## ලිපිලේඛනාදිය පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2009 වර්ෂයේ විගණකාධිපති වාර්තාව, විගණකාධිපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරනු ලදුව 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 . 2 පරිදි මෙය පළාත් සභාවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දී ඇති,

1. බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව හා

2. බස්නාහිර පළාත් සභාවේ 2009 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව මම මේ සභාවට ඉදිරිපත් කරනවා. එම විගණකාධිපති වාර්තාවන් කාර්ය පටිපාටි රීති අංක 90 - (1) හි විධිවිධාන අනුව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරනවා.

## කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2012.12.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

මීළඟට ප්‍රඥප්ති හා නීති පිළිබඳව කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කිරීමට එම කාරක සභාවේ සභාපති හෝ කමිටු සාමාජික මන්ත්‍රීවරයෙකුට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, *"2012.12.19 දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා."*

*අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.*

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members*

# පෙත්සම්
# PETITIONS

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, බේරුවල, පාදාගොඩ, ඔලින්ද්වත්ත, ටී.ඒ. පියදාස යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***[සභා මේසය මත තබන ලද පෙත්සම]**
*[Petition Tabled]*

රෙහෙන්සිරි වරාගොඩ ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

කළුතර උතුර, ගාලු පාර, අංක 377/1 හි පදිංචි ඒ.පී. කවිරත්න යන අයගේ පෙත්සම.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.*

*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම පොඩි වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට කාරණයක් මතුකරන්න කැමතියි. ගරු සභාපතිතුමනි, දැන් අපේ සභාවට පසුගිය විගණන වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ විගණන වාර්තාව පරිශීලනය කිරීමේදී අපිට දැනෙනවා, ගැටළු ගණනාවක් මතුවෙලා තියෙන බව. මම හිතන්නේ, ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් නිවැරදි වීමක් වෙනවාද? දැනට ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳව යම් අදහසක් පළ කරන්න, එහෙම නැත්නම් ඒ පිළිබඳව සාකච්ඡාවකට මේ සභාවේ ඉඩ කඩ ලබා දීමක් කරන්න පුළුවන්ද කියන එක මම අහන්න කැමතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා අපි ඒ සඳහා. ඉක්මනටම පක්ෂ නායක රැස්වීමක් කැඳවලා, අපි ඒ පිළිබඳව සාකච්ඡා කරලා තීන්දුවකට එළඹෙමු.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

## සී/ස පිළියන්දල බෝකුන්දර සමූපකාර සමිතිය
COOPERATIVE SOCIETY LIMITED OF BOKUNDARA, PILIYANDALA

**01.**

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපාකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(1)12/26)**

අ. සී/ස පිළියන්දල බෝකුන්දර සමූපකාර සමිතියේ මහා සභා කාලය 2010.05.21 වන දින අවසන් වූ අතර, පසුගිය වසර දෙක තුළ ඡන්ද විමසීමක් පැවැත්වීමට කොමසාරිස්තුමා අසමත් වී ඇති බැවින් ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

ආ. ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ 35 ‘අ’ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ යුත්තේ රාජ්‍ය නිලධාරීන් වන අතර, දැනට කොමසාරිස්තුමා විසින් පත් කර ඇති හිටපු සභාපති නන්දලාල් ජයසුන්දර මහතා හා ඒ.ඒ.ඩී. සුනිල් යන අය දැරූ රාජ්‍ය තනතුරු මොනවාද? කාල වකවානු කවරේද?

ඇ. ඉහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් නගරයේ ව්‍යාපාරිකයින් වන අතර, මොවුන් පත් කිරීම නීති විරෝධී බව ඔබතුමා දන්නේද? එසේ නම් එම නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද?

ඈ. මෙම සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් ගරු ගාමිණී ලොකුගේ අමාත්‍යතුමා සහ ගරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙස දන්වා ඇති අතර, ඒ සම්බන්ධයෙන් ගත් පියවර කවරේද?

ඉ. ඔබතුමා විසින් නිපුනතා ඇති රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කළ පසු නැවතත් ඡන්ද විමසීමක් පවත්වන්නේ කවදාද?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ . ඡන්දය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

ආ. කොමසාරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිලධාරීන් පත් කර ඇත්තේ ප්‍රඥප්තියේ 60 වගන්තිය අනුව නොවන අතර 48 (3) වගන්තියට අනුකූලව පත් කිරීම් සිදු කර ඇත.

ඇ. පත් කිරීම් නීති විරෝධී නැත.
අදාළ නැත.

ඈ. පරීක්ෂණ ආරම්භ කර ඇත.

ඊ. පත් කරනු ලබන පාලක මණ්ඩලය විසින් ඡන්දය පැවැත්වීම සඳහා දින නියම කරනු ඇත.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමාගෙන් මම (ආ) ප්‍රශ්නයේදී අහලා තියෙන්නේ - ඒ නිලධාරීන්ගේ නම් කියලා තියෙනවා. ඔවුන් දැරූ තනතුරු මොනවද? රාජ්‍ය සේවයේ ඔවුන් දැරූ තනතුරු මොනවද කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

විශ්‍රාමිකයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

විශ්‍රාමික නොවෙයි. මේ චක්‍රලේඛයේ තියෙනවා කරන්න පුළුවන් තනතුරු මොනවද කියලා. ඔබතුමාගෙන් මම අහන්නේ ඒ නිලධාරීන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නෙට ගරු ඇමතිතුමා

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අළුත් චක්‍රලේඛයට අනුව -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මොකක්ද චක්‍රලේඛයේ අංකය? මේ මන්ත්‍රීතුමා නොවෙයි නේ -

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අළුත් චක්‍ර ලේඛනයට අනුව රජයේ නිලධාරීන්ටත් පුළුවන් විශ්‍රාමික නිලධාරීන්ටත් පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. අනික් ගරු මන්ත්‍රීවරු ඉන්න. එතුමන්ලා දෙන්නා ඒක බේරගනියි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අළුත් චක්‍රලේඛය අනුව රජයේ

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මොකක්ද අංකය?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

රජයේ විශ්‍රාම නිලධාරීන්ටත් පුළුවන්. රජයේ නිලධාරීන්ටත් පුළුවන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. ඔවුන්ගේ නිල තනතුර මොකක්ද? මම අහන්නේ තනතුරු මොනවද? දැන් මෙතුමා කියන පරිදි වැසිකළි සෝදන එක්කෙනෙක්ව පත් කරන්න පුළුවන්ද මේකට.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මොකක්ද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වැසිකිළි පවිත්‍ර කරන්න ඉන්න සුළු කම්කරුවෙක් පත්කරන්න පුළුවන්ද? සභාපති කරලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, එතුමා අහන්නේ මේ නන්දලාල් කියන මහත්මයා සහ සුනිල් කියන මහත්වරු දෙන්නා දැරූ තනතුරු මොකක්ද කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මන්ත්‍රීතුමා ඔයාට තේරුම් කරගන්න බැරිද? මගෙන් අහලා තියෙනවා, 60 වන වගන්තිය යටතේ නේ. එතකොට මම 60 වන වගන්තිය යටතේ නොවෙයි නේ පත් කරලා තියෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හරි, මොකක් හරි උත්තරයක් ඔබතුමා -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම දැන් උත්තරය දීලා තියෙනවා, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාලට විවාදයකට යන්න ඉඩ දෙන්න බැහැ,

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මොකක්ද ආයතනය මම අහන්නේ? ගරු සභාපතිතුමනි මම අහන්නේ ඇමතිතුමාගෙන් මොකක්ද තනතුරු කියලා. මම අහන්නේ ඇමතිවරයාගෙන් මේකට පත් කළ -

[සභාවේ ඝෝෂා]

උත්තර දෙන්නේ පත් කරපු මන්ත්‍රීවරයා. ඒකයි ප්‍රශ්නෙ වෙලා තියෙන්නේ. මෙතන මම අහන්නේ අදාළ ඇමතිවරයා කවුද පත් කළේ කියන එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. දිගින් දිගටම විවාදවලට යන්න දෙන්න බැහැ, ප්‍රශ්න ඉදිරිපත් කිරීම සම්බන්ධව. නම් දෙක කියන්න කෝ. ඔබතුමා නම් දෙක කියන්න කෝ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම අහන්නේ මේ නිලධාරීන් රාජ්‍ය සේවයේ දැරූ තනතුරු මොනවද? වකවානු මොනවාද? කොහෙද වැඩ කළේ? මොකක්ද තනතුරු?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දැන් බැරි නම් පස්සේ උත්තර දෙන්න. සරල ප්‍රශ්නයක් එතුමා අහන්නේ. ඔබතුමා පසුව උත්තර දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමතිතුමාට කවදාවත් උත්තර දෙන්න බැහැ ,

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දැන් සභාපතිතුමා ප්‍රශ්නෙ අහලා තියෙන්නේ,

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ කෑගහනවා. එතුමාට උත්තර දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එයා අහලා තියෙන්නේ 60 වෙනි වගන්තිය යටතේ (බාධා කිරීමක්) දැන් එයා අහලා තියෙන්නේ 60 වගන්තිය යටතේ. 60 වන වගන්තිය යටතේ මම පත් කරලා නැහැ. 48(3) වගන්තිය යටතේ තමයි මම පත්කරලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ගරු ඇමතිතුමා. එතුමා අහන්නේ මේ දැරූ තනතුරු මොනවද කියලයි. බොහොම සරල ප්‍රශ්නයක් මේ තියෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ අහන්නේ පත් කරපු අයගේ තනතුරු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තේරෙන භාෂාවෙන් අහන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ විකාරේ? ඔබතුමා මේ මොකක්ද ප්‍රකාශ කරන්නේ? මේ මොකක්ද මේ කියන්නේ? මේ මන්ත්‍රීතුමා මොනවාද ඇමතිතුමාට කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හිටපු ඇමතිතුමා උත්තර දෙන්න යනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හොරාගේ අම්මගෙන් පේන අහන්න එපා. සමුපකාරයේ හොරකම් කරනවා. නගර සභාවේ කෝටි ගණනාවක් හොරකම් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සභා නායකතුමා. සභානායකතුමාට පුළුවන්. එතුමාට ඉඩකඩ තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමා ප්‍රශ්නෙට උත්තර දෙන්න කෝ. ඔබතුමා දැන් උත්තර දෙන්න කළබල වෙන්න ඕනෑ නැහැ. ඔබතුමා ප්‍රශ්නෙට පසුව උත්තර දෙන්න. අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ බලන්න කෝ පත් කළ මන්ත්‍රීතුමා මොනවද මේ කරන්නේ?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අහලා තියෙන ප්‍රශ්නයට තමයි මම උත්තර දෙන්නේ. ආයි ඇහුවහම –

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම දෙවැනි ප්‍රශ්නේ බොහොම පැහැදිලිව අහනවා. දැරූ රාජ්‍ය තනතුරු මොනවාද? දැරූ වකවානු කවරේද? කියලා

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම 60 වගන්තිය යටතේ පත් කරලා නැහැ. මම 48(3) වගන්තිය යටතේ පත් කරලා තියෙන්නේ. එතකොට 48(3) වගන්තිය –

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මේ ආසනයෙන් පිට මේ ආසනයෙන් පිට

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්දවන්න. නිශ්ශබ්දවන්න ගරු අමාත්‍යතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මට පොඩ්ඩක් සමාවන්න. එතුමා (ආ) ප්‍රශ්නයෙන් අහලා තියෙන්නේ. ප්‍රඥප්ති 60 වන වගන්තියේ 35 (ආ) අනුව අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ යුත්තේ රාජ්‍ය නිලධාරීන් වන අතර දැනට කොමසාරිස්තුමා විසින් පත් කර ඇති හිටපු සභාපති නන්දලාල් ජයසුන්දර මහතා හා ඒ.ඒ.සී අය දැරූ රාජ්‍ය තනතුරු මොනවාද කියන එක. එච්චරයි අහන්න තියෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කාල වකවානු මොනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් කාල වකවානු ඉතිං ඔබතුමා ඒකට උත්තරයක් දෙන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමා, 60 වන වගන්තියේ, –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

60 වන වගන්තියේ නොවෙයි.

[සභාවේ ඝෝෂා]

එතුමා අහන්නේ බොහොම සරල ප්‍රශ්නයක්. සරල ප්‍රශ්නයක් අහන්නේ. දැරූ තනතුරු කියන්න ඔබතුමා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

රාජ්‍ය සේවයේ හිටපු තනතුරු

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දැන් ඒ උත්තරේ ලැබිලා නැත්නම් පස්සේ දෙන්න උත්තරේ. කමක් නැහැ. පස්සේ දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

රාජ්‍ය සේවයේ දරපු තනතුරු මොනවාද කියලා අහන්නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමා, මොන වගන්තියෙන් පත් කළත් මේ දෙන්නම තමයි පත්කරලා තියෙන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමාගේ කාලයේ දී උත්තරයක් දෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ දිගින් දිගටම මේ ප්‍රශ්නෙ යන්න දෙන්න බැහැ. ඔබතුමා ප්‍රශ්නෙට උත්තර දෙන්න ගරු ඇමතිතුමා. ඔබතුමා කල් ඉල්ලන්න. ඊළග සභාවේදී එතුමා උත්තර දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනාධිපතිතුමාගෙන් අහලා උත්තරේ දෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ඔබතුමා නිශ්ශබ්ද වන්න. ඊළග සභාවට එතුමා ඒ සම්බන්ධව උත්තර දෙනවා.

# බත්තරමුල්ල සමූපකාර සමිතියේ නව අධ්‍යක්‍ෂ මණ්ඩලය : විදේශ සංචාර

NEW DIRECTOR BOARD OF THE COOPERATIVE SOCIETY OF BATTARAMULLA : FOREIGN TOURS

**02.**

**එස්.ඒ.ඩී.ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සමූපාකාර හා සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V(1)12/28)**

අ. බත්තරමුල්ල සමූපකාර සමිතියේ නව අධ්‍යක්ෂක මණ්ඩලය පත්වීමෙන් පසු කොපමණ වාර ගණනක් සභාපතිවරයා විදේශගත වී ඇත්ද?

ආ. විදේශ ගත වූ රටවල් මොනවාද?

ඇ. ඒ සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද? ඒ කුමන ආයතන විසින්ද?

ඈ. ඒ පිළිබඳව වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඉ. නව අධ්‍යක්ෂක මණ්ඩලය හා සභාපතිවරයා පත්වූ පසු සමිතියට අයත් වෙළඳ සැල් නිසි අයුරින් පවත්වාගෙන යාමට, නිසි කළමනාකරණය කිරීමට නොහැකි වී ඇති බව ඔබතුමා දන්නේද?

ඊ මෙම නව අධ්‍යක්ෂක මණ්ඩලය පත්වූ පසු සමිතියට අයත් වෙළඳ සැල් කිහිපයක් වසා දමා තිබෙන බව ඔබතුමා දන්නේද?

උ. එසේම වෙළඳ සැල් කිහිපයක් ( ප්‍රාදේශික) බදු දී ඇති බව ඔබතුමා දන්නේද? එසේ නම් ඒ කුමන ප්‍රාදේශිකද?

ඌ. එසේ බදු දීමට සමූපකාර දෙපාර්තමේන්තුවෙන් අවසර ගෙන තිබේද? එසේ නැතිනම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

එ. මෙම සමිතිය අයත් මාලබේ සමූපකාර අවන්හලේ ලක්ෂ 05ක බඩු අඩුවීමක් සිදුවී ඇති බව ඔබතුමා දන්නේද? එසේ දන්නේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අ. 04 යි.

ආ. තායිලන්තය, මැලේසියාව, ඉන්දියාව, කාම්බෝජය.

ඇ. රුපියල් දෙලක්ෂ අනූපන්දහස් පන්සීය දාහතරයි.
වියදම් දැරීම වෙස්කෝ ආයතනය විසින් හා කොළඹ දිස්ත්‍රික් සමූපාකාර ග්‍රාමීය බැංකු සංගමය විසින්.

ඈ. ඔව්. වෙස්කෝ ආයතනයෙන් රුපියල් හැට නවදාස් නවසීය හයයි.
බැංකු සංගමයෙන් රුපියල් දෙලක්ෂ විසිපන්දාස් හයසීය අටයි.

ඉ. නැත.

ඊ. ඔව්.

උ. බදු දී නොමැත.

ඌ. අදාළ නැත.

එ. ඔව්.
බඩු අඩුවීම් වටිනාකම් අය කර ගැනීමට හා වගකිව යුත්තන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කොමසාරිස්වරයාට මා විසින් උපදෙස් දී තිබේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. අතුරු ප්‍රශ්න තුනක්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බදු දී නොමැති නම් ඒ වෙළෙඳ සැල් පවත්වාගෙන යන්නේ කුමන ආයතනයක්ද? කවරෙක් විසින්ද? බදු දී නොමැති නම් ප්‍රාදේශික වෙළෙඳ සැල් පවත්වාගෙන යන්නේ කුමන අයෙක් විසින්ද? කුමන බලයක් යටතේද? සමූපකාර සමිතියේ පාලනය යටතේද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සමූපාකාර බැංකුව හදලා තියෙන්නේ, සමූපාකාර දිස්ත්‍රික්කයේ ඒ සමූපාකාර ග්‍රාමීය බැංකු ඒකරාශී වෙලා, ඒ ග්‍රාමීය බැංකුවලින් එන අතිරික්ත මුදල තැන්පත් කරලා දිස්ත්‍රික් ග්‍රාමීය බැංකුව කියලා එකක් හදලා තියෙනවා. ඒ අනුව ඒගොල්ලන්ට ඒ ලාභ ප්‍රතිශතය අනුව අපි විදේශ සංචාර සඳහා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමාලා පෞද්ගලික කතා බහෙන් පොඩ්ඩක් වළකින්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මම ඇමතිතුමාගෙන් ඇහුවේ ඒ ප්‍රශ්නය නොවෙයි. ප්‍රාදේශික බදු දීලා නැහැයි කියලා ඔබතුමා කියනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු සභාව නිශ්ශබ්ද වන්න. මේ ඇමතිතුමයි, මන්ත්‍රීතුමයි කියන කිසි දෙයක් ඇහෙන්නේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු ඇමතිතුමා කියනවා ප්‍රාදේශික බදු දී නැහැයි කියලා. මම දන්න විදියට ප්‍රාදේශික වෙනත් අයට පවරලා තියෙනවා. එහෙම පවරලා තියෙන්නේ කොහොමද? කාටද? කියන කාරණාවයි මම අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඒ සම්බන්ධව ඔබතුමා ළඟ පිළිතුරු නැත්නම්.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මගෙන් අහලා තියෙන දේට තමයි මම උත්තර දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව එතුමාට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් ගරු ඇමතිතුමා. ඔබතුමා ප්‍රශ්නෙට උත්තර දෙන්න. එතුමාගේ අතුරු ප්‍රශ්නවලට උත්තර ලබන වර දෙන්න.

# බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ සේවකයින් : අනුමත දීමනා

EMPLOYEES OF THE MULTIPURPOSE COOPERATIVE SOCIETY : APPROVED ALLOWANCES

**03.**

**ගරු එස්.ඒ.ඩී.ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපාකාර සංවර්ධන ,ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(1)12/29)**

අ. බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ බර වාහන සැහැල්ලු වාහන රියැදුරන්, ගබඩා කම්කරුවන් සඳහා සමූපකාර කොමිෂන් සභාවේ අනුමත දීමනා නොගෙවන බව ඔබතුමා දන්නේද? එසේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග මොනවාදඃ?

ආ. මෙම සමිතියේ සමූපකාර කොමිෂන් සභා චක්‍රලේඛ අංක 5/2012 මඟින් බස්නාහිර පළාතේ සියලු සමූපකාරවල සේවයේ නිරත ස්ථිර සේවකයන් සඳහා මාසික මූලික වැටුපෙන් 15% විශේෂ දීමනාවක් 2012 මැයි මස සිට ගෙවීමට තීරණය කර තිබියදී එය නොගෙවමින් සේවකයින්ට අසාධාරණයක් සිදු කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඇ. සේවයෙන් ඉල්ලා අස්ව හා විශ්‍රාම ගිය සේවකයන්ට මෙම සමිතිය විසින් නීති විරෝධී අයුරින් පාරිතෝෂික මුදල නොගෙවන බව ඔබතුමා දන්නේද?

ඈ. පාරිතෝෂික මුදල් ලබාදී නැති සේවක පිරිස් ඔබතුමා දන්නේද? ඒ දන්නේ නම් වෙන වෙනම නම් සඳහන් කරන්නේද?

ඉ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමෙන් පසු සේවකයන් කී දෙනෙකු සේවයෙන් ඉවත්වී හෝ ඉවත් කර තිබේද? ඒ අය වෙන වෙනම සඳහන් කරන්නේද? නව සේවකයන් කොපමණ සංඛ්‍යාවක් බඳවාගෙන තිබේද? ඒ අය අදාළ මූලික සුදුසුකම් සපුරා තිබේද?

ඊ. සුදුසුකම් නැති සේවකයන් බඳවා ගැනීම පිළිබඳව ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අ. ඔව්.
සමිතිය ආර්ථික හැකියාව මත දැනට මාසිකව රුපියල් 1000ක දීමනාවක් මෙම සේවකයින්ට සමිතිය විසින් ගෙවනු ලැබේ.

ආ. සමිතියේ ආර්ථික හැකියාව මත සීයට පහළොවක විශේෂ මාසික දීමනාවෙන් අඩක් දැනට සමිතිය විසින් සේවකයින්ට ගෙවනු ලැබේ.

ඇ. ඔව්.

ඈ. ඔව්.
1. සුනේත්‍රා නන්දසීලි මහත්මිය
2. එස්. සමරසිංහ මහතා
3. ඒ.කේ.ලෙස්ලි පෙරේරා මහතා
4. ජේ.කේ.වයලට් මහත්මිය
5. පී.ජී. ගුණරත්න මහතා

ඉ. 05කි.

1. සුසන්ත ගුණසේකර මහතා
2. හර්ෂණ නවෝදන මහතා
3. කේතක සුභාෂ් මහතා
4. මාලා කොළඹතන්ත්‍රී මහත්මිය
5. ගිනිගේ නදීශා නිර්මලී මහත්මිය

අළුතින් බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව 37කි.
අදාළ මූලික සුදුසුකම් සපුරා ඇත.

ඊ. සුදුසුකම් නැති සේවකයින් බඳවාගෙන නැත.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්න කිහිපයක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, එතුමා ඔබතුමාට අතුරු ප්‍රශ්නයක් යොමු කරනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

සේවකයන් ඉල්ලා ඇති, ඒ සේවකයන්ට ලැබිය යුතු පාරිතෝෂික මුදල් නොගෙවන්නේ නම් – ඒක ඔවුන්ගේ අයිතියක්. ඒ පිළිබඳව ඔබතුමා ගන්න ක්‍රියා මාර්ගය. ඒ වගේම මේ සේවකයන්ට දීමනා ලබා දීම සඳහා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දීලා තියෙනවා. එහෙම ලබා දී තිබියදී නොගෙවන්නේ නම්, ඒ සඳහා වෙනත් ක්‍රියා මාර්ගයක් ගන්න පුළුවන්කම තියෙනවාද ? ඒ වගේම ගරු සභාපතිතුමා මඟින් ගරු ඇමතිතුමාගෙන් අහනවා දැන් මේ සමිතිය බඳවගත්ත නිලධාරීන්ගේ සුදුසුකම් පිළිබඳව ඔබතුමා පරීක්ෂා කරලද මේ පිළිතුර දෙන්නේ කියලා. අපි දන්න විධියට එහෙම නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අතුරු ප්‍රශ්න 3 ක් ඔබතුමාට ඉදිරිපත් කළා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සභාපතිතුමා, ඒ පඩි චක්‍රලේඛ අනුව නිකුත් කරලා තියෙන්නේ. සමූපාකාරවල තියෙන ආදායම් අනුව තමයි, අපි ඒගොල්ලන්ගේ පඩි Scale 6 ක් දීලා තියෙනවා, අළුතෙන් පියවරක්, පඩි ගෙවන්න ඕනැ ප්‍රමාණවල් හයක් දීලා තියෙනවා. එතකොට එක එක සමිතියට ඇති හැකියාව අනුව තමයි ඒගොල්ලන්ගේ පඩි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන්නේ. මොකද අපේ දෙපාර්තමේන්තුව විසින්වත් අපේ අමාත්‍යාංශයෙන්වත් පඩි ගෙවන්නේ නැහැයි. එහෙම මුදලක් අපේ පළාත් සභා වෝට් එක ඇතුළේ නැහැ. එතකොට අපිට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. රජයෙන්වත් පාර්ලිමේන්තුවෙන්වත් ඒ අනුමත වුණු එහෙම අරමුදලකුත් නැහැ, ඒ වගේ ආයතනවලට මේ විධියට පඩි ගෙවන්න.

## බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ පරීක්ෂණ නිලධාරිනිය : සභාපතිතුමා බැණ වැදීම
INVESTIGATION OFFICER OF THE MULTIPURPOSE COOPERATIVE SOCIETY OF BATTARAMULLA : CHAIRMN'S SCOLDINGS

**04.**

**ගරු එස්.ඒ.ඩී.ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපාකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(1)12/30)**

අ. බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ පරීක්ෂණ නිලධාරිනියකට සභාපති නිශාන්ත උඩවත්ත යන අය බැන තර්ජනය කර එලවා තිබෙන බව ඔබතුමා දන්නේද?

ආ. දැනටත් මෙම සමිතියේ කටයුතු සිදුවන්නේ සමූපකාර නිලධාරින්ගේ අධීක්ෂණයෙන් තොරව බව ඔබතුමා දන්නේද? එසේ දන්නේ නම් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඇ. මෙම සමූපකාර සමිතියේ නව අධ්‍යක්ෂක මණ්ඩලය තුළ සමිතියේ ණය පැහැර හරින ලද අධ්‍යක්ෂවරු සිටින බව ඔබතුමා දන්නේද?

ඈ. සමූපකාර සභාපතිවරයා වන නිශාන්ත උඩවත්ත යන අයගේ තනි හා නීති විරෝධී තීරණ හේතුවෙන් සමිතිය දිනෙන් දින අගාධයට පත් වෙමින් තිබෙන බව ඔබතුමා දන්නේද? එසේ නම් එයට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඉ. මෙම සමිතිය මහජන බැංකුව වෙත ගෙවීමට ඇති ණය අයිරාව කොපමණද? නව අධ්‍යක්ෂක මණ්ඩලය පත් වීමෙන් පසු අයිරාව අඩුවීද? වැඩිවීද? එසේ නම් ඒ කොපමණද?

ඊ. මෙම සමිතිය මේ වන විට වෙනත් ආයතන වලට ගෙවීමට ඇති මුළු ණය ප්‍රමාණය වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

උ. මෙම සමිතියේ නව අධ්‍යක්ෂක මණ්ඩලය පත්වීමෙන් පසු කොපමණ ණය ප්‍රමාණයක් ලබාගෙන තිබේද? ඒ කුමන ආයතනවලින් දැයි වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අ. බැණ තර්ජනය කර එළවා දැමීමක් සිදුව නැත.

ආ. සමිතියේ කටයුතු සමූපකාර නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ සිදුවේ.

ඈ. ඔව්.
ප්‍රඥප්තිය හා රීති ප්‍රකාරව කටයුතු කරන ලෙස කොමසාරිස්ට උපදෙස් දී තිබේ.

ඈ. සභාපතිවරයා තනි හා නීති විරෝධී තීරණ ගෙන නැත. සමිතියේ කළමනාකරණ දූර්වලතා මහහරවා ගන්නා ලෙස සමිතියට උපදෙස් දී තිබේ.

ඉ. රුපියල් හාරකෝටි නව ලක්ෂ පනස් තුන් දහස් දෙසීය අනූ නවයකි.
අයිරාව වැඩිවී ඇත.

රුපියල් එක් කෝටි හැත්තෑ හතර ලක්ෂ හැට හතර දහස් හයසීය විසිතුනකින් අයිරාව වැඩිවී ඇත.

ඊ. සභාගත කරමි.[1]

උ. කොළඹ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයෙන් රුපියල් එක්කෝටි විසිහය ලක්ෂ හතලිස් පන්දහස් නවසීය අනූනවයයි.



සී/ස බත්තරමුල්ල විවිධසේවා සමූපකාර සමිතිය
2012.10.31 දිනට වෙළඳ ණයහිමි ශේෂය

| අනු අංකය | ආයතනය | ශේෂය |
|---|---|---|
| 1 | එච්.කේ.එල්.වී.පෙරේරා | 2940.00 |
| 2 | ජනිත ට්‍රේඩර්ස් | 37533.30 |
| 3 | ඇන්ට්ලර් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් | 32231.50 |
| 4 | ටී.සී.තියාකාර | 6440.00 |
| 5 | ඩී.ඩී.වී.චමින්ද | 2500.00 |
| 6 | එම්.එච්.පී.එස්.සෝමවත්ත | 14861.50 |
| 7 | සුසද එන්ටප්‍රයිසස් | 27550.00 |
| 8 | එස්.පී.අල්විස් | 8810.50 |
| 9 | ජී.වී.ජී.සම්බත් | 681.00 |
| 10 | සෙන්රා ටී | 32241.60 |
| 11 | එම්.ඉසෙඩ්.ලාහිර් | 94812.00 |
| 12 | එල්.ජී.සී.ජිරත් | 69639.00 |
| 13 | ආර්.පී.ඩී.ඩී.එම්.ද අල්විස් | 13154.90 |
| 14 | ඇග්‍රෝ ඩිස්ට්‍රි බියුටර්ස් | 135536.37 |
| 15 | ජයන්යා එග් සප්ලයර්ස් | 66291.00 |
| 16 | ඉන්දික එන්ටප්‍රයිසස් | 88330.00 |
| 17 | ශ්‍රීලංකා පොල් නිපදවන්නන්ගේ සමූ.සමිති සංගමය | 205274.00 |
| 18 | රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව | 955989.00 |
| 19 | එම්.එම්.කියාමදීන් | 249221.00 |
| 20 | අජිත් එන්ටප්‍රයිසස් | 56428.40 |
| 21 | නා ලංකා ට්‍රේඩින් | 190278.00 |
| 22 | මස්කෙළිය කහට තේ ප්‍රයිවට් ලිමිටඩ් | 4672.80 |
| 23 | ශ්‍රීලංකා තේ නිපදවන්නන්ගේ සමූ.සමිතිය | 29448.20 |
| 24 | සී.ආර්.එන්ටප්‍රයිසස් | 1354.00 |
| 25 | කේ.අයි.එම්.ඉලංගකෝන් | 23920.00 |
| 26 | සමිත ඩිස්ට්‍රිබියුටර්ස් | 29866.00 |
| 27 | සී/ස බස්නාහිර පළාත් පාරි. හා අලෙවි සමූ.ස.සංගමය | 1322567.90 |
| 28 | ආර්.ඩී.ජී.දිසානායක | 7020.00 |
| 29 | ලංකා ධීවර සංස්ථාව | 111954.00 |
| 30 | මහින්ද මිතුන් ලොකුහේවා | 12552.30 |
| 31 | ආර්.ඩබ්.එම්.කේ.බණ්ඩාර | 2250.00 |
| 32 | බී.ඩී.එස් සිරිවර්ධන | 49314.00 |
| 33 | කේ.කේ.වී.පෙරේරා | 15440.02 |
| 34 | එක්සෙල් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 216670.70 |
| 35 | ඩබ්.ඩබ්.පී.ආර්.මෙන්ඩිස් | 30000.00 |
| 36 | ට්‍රිමිරෝන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 7447.50 |
| 37 | සෙනදු ඩිස්ට්‍රිබියුටර්ස් | 32715.10 |
| 38 | විලේජ් ස්පයිස් | 14214.00 |
| 39 | කේ.ඩී.ජයසිංහ | 5000.00 |
| 40 | ට්‍රාන්ස් ඉන් ඒෂියා ගෲප් ප්‍රයිවට් ලිමිටඩ් | 7236.00 |
| 41 | කේ.ජී.එල්.සිරිවර්ධන | 4642.00 |
| 42 | ග්‍රීන් අයිලන්ඩ් මාකටිං සර්විසස් ප්‍රා.ලිමිටඩ් | 16551.20 |
| | එකතුව ප/ගෙ | 4235578.79 |
| | එකතුව ඉ/ගෙ | 4235578.79 |
| 43 | පී.එල්.ජී.දයානි ජයසිංහ | 13390.00 |
| 44 | පතිරණ ඩිස්ට්‍රිබියුටර්ස් | 62194.37 |
| 45 | සෙන් ලංකා ෆුඩ් ඉන්ඩස්ට්‍රීස් | 9657.50 |
| 46 | ජී.කේ.ටී.ඩිස්ට්‍රිබියුටර්ස් | 41476.00 |
| 47 | අයි.ටී.ඩබ්.මුණවීර | 20254.48 |
| 48 | ඒ.එච්.වී.ඉන්ද්‍රකුමාර | 57214.50 |
| 49 | ඩබ්.එම්.එම්.ප්‍රසාත් | 14206.00 |
| 50 | බේලි ටී මාස්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 10000.00 |
| 51 | පී.බී.ප්‍රසාද් සුජීව ගුණතිලක | 7434.00 |
| 52 | ජීවන්සිත් එන්ටප්‍රයිසස් | 22290.00 |
| 53 | ඩබ්.ඒ.ආර්.එස්.සල්ගාදු | 55000.00 |
| 54 | හෝටන් තේ පුද්ගලික සමාගම | 11067.00 |
| 55 | සී.කුමාරගේ | 24929.64 |
| 56 | සංජීව පෙරේරා | 4901.00 |
| 57 | දික්රෑ ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් | 51701.00 |
| 58 | වින්සෙල් එජන්සීස් | 53705.00 |
| 59 | මහරගම විවිධසේවා සමූපකාර සමිතිය | 32687.39 |
| 60 | ලහිරු ප්‍රඩක්ට්ස් | 14000.00 |
| 61 | එස්. ඇන්ඩ් එස්. ඩිස්ට්‍රිබියුටර්ස් | 21778.60 |
| 62 | ගෙන්බිස් එන් ලංකා | 3213.00 |
| 63 | මදුෂිකා ස්විට්ස් | 57487.60 |
| 64 | ටී.සී.මාකටිං සර්විසස් | 14250.00 |
| 65 | දේශිනි එන්ටර්ප්‍රයිසස් | 324326.05 |
| 66 | නිහාල් ඩිස්ට්‍රිබියුටර්ස් | 38326.80 |
| 67 | ඩීල් ෆුඩ්ස් ප්‍රයිවට් ලංකා ලිමිටඩ් | 215906.31 |
| 68 | ගිනගල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 18970.40 |
| 69 | සී/ස හෝමාගම වි.සේ.ස.සමිතිය | 55202.50 |
| 70 | ඒ.කේ.ඩී.ඩී.කමල්සිරි | 17056.32 |
| 71 | ලිඳුල තේ පුද්ගලික සමාගම | 10326.20 |
| 72 | ඇක්වෙල් ඩිස්ට්‍රිබියුටර්ස් | 17781.60 |
| 73 | රිද්මා ඩිස්ට්‍රිබියුටර්ස් | 8338.50 |
| 74 | කුන්වෙල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 13422.00 |
| 75 | ලකි ලංකා මිල්ක් ප්‍රොසෙසිං කම්පැනි ලිමිටඩ් | 15720.50 |
| 76 | තුවන් එන්ටර්ප්‍රයිසස් | 31012.50 |
| 77 | ජගත් ප්‍රසන්න වෙත්තසිංහ | 4176.00 |
| 78 | මෙඩි මාකට් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රා.ලිමිටඩ් | 4500.00 |
| 79 | වයි.ජී.පී.ජේ.යහම්පත් | 7535.00 |
| 80 | නුවන් එන්ටර්ප්‍රයිසස් | 16510.00 |
| 81 | මොහොමඩ් ධර්මේෂ් මොහොමඩ් සුහයිස් | 38621.25 |
| 82 | සදෙව් එන්ටර්ප්‍රයිසස් | 56569.74 |
| 83 | පෙරේරා ඩිස්ට්‍රිබියුටර්ස් | 33841.90 |
| 84 | එල්.ජී.සී.එන්ටර්ප්‍රයිසස් | 197688.00 |
| 85 | පී.සමරවීර | 13930.00 |
| 86 | අනෝමා සිරිවර්ධන | 2070.00 |
| 87 | වෙස්ට්වෝල් වෙනිවැල් කම්පැනි ප්‍රා.ලිමිටඩ් | 46161.80 |
| | එකතුව ප/ගෙ | 6026409.24 |

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.

| | | |
|---|---|---|
| | එකතුව ඉ/ගෙ | 6026409.24 |
| 88 | පැලවත්ත සීනි සමාගම | 55000.00 |
| 89 | ඩී.පී.පී.ජයසේකර | 8342.00 |
| 90 | ෂෙරින් ප්‍රඩක්ට්ස් | 4880.00 |
| 91 | හේවාගම් කෝරලයේ බටහිර විවිධසේවා සමුපකාර සමිතිය | 6816.00 |
| 92 | ආර්.ටී.බී.පී.රත්නායක | 13950.00 |
| 93 | ජේ.එල්.ආර්.රොද්‍රිගෝ | 457764.75 |
| 94 | සොලිඩ් මාකටිං | 67605.00 |
| 95 | හේලියර් එන්ටර්ප්‍රයිසස් | 149315.98 |
| 96 | වෙරිබියම් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 79809.77 |
| 97 | ජනසෙත මාකටිං සර්විසස් | 25008.60 |
| 98 | ඒ.කේ.සී.පෙරේරා | 31937.67 |
| 99 | එන්.වී.ආර්.පෙරේරා | 28850.00 |
| 100 | ආර්.පී.ටී.සී.රාජපක්ෂ | 42592.00 |
| 101 | එම්.එල්.එස්.කේ.උක්වත්ත | 16865.95 |
| 102 | කේ.පී.එන්.ජනිත් කුමාර | 17612.00 |
| 103 | ආසිරි ඉන්ඩස්ට්‍රීස් | 9110.00 |
| 104 | ලක්වින් එන්ටර්ප්‍රයිසස් | 112242.00 |
| 105 | පත්මකාන්ති පෙරේරා | 5335.50 |
| 106 | සා එන්ටර්ප්‍රයිසස් | 74125.00 |
| 107 | ඊ.ඒ.එස්.පෙරේරා | 32800.00 |
| 108 | සදලි ඩිස්ට්‍රිබියුටර්ස් | 1755.00 |
| 109 | ජේ.ඒ.සී.එස්.ජයකොඩි | 39550.30 |
| 110 | එන්.එන්.පී.පෙරේරා | 12464.00 |
| 111 | ලින්ඩා හිලාඩි | 14464.70 |
| 112 | දුලංජා ඒජන්සීස් පු.ලිමිටඩ් | 14823.35 |
| 113 | එක්සෙල් ට්‍රේඩිං ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ් | 773398.04 |
| 114 | වී.එච්.එස්.ධම්මිකා | 9735.40 |
| 115 | ඩබ්.ඒ.ඩී.සුනිල් | 31850.00 |
| 116 | පී. ඇන්ඩ් ජී. එන්ටර්ප්‍රයිසස් | 10542.85 |
| 117 | කේ.ඩී.දිසානායක | 71860.10 |
| 118 | සුනිල් ට්‍රේඩර්ස් | 911810.23 |
| 119 | පෙරේරා ඇන්ඩ් කම්පැනි | 357560.00 |
| 120 | සී/ස දෙනිවල-ගල්කිස්ස වි.සේ.ස.සමිතිය | 44338.15 |
| 121 | ඩී.ඩී.ශ්‍රියානි | 15172.50 |
| 122 | එස්.ඩී.එන්.ආරියනන්ද | 1800.00 |
| 123 | නුවර තේ කම්පැනි පු.ලිමිටඩ් | 8928.00 |
| 124 | එම්.බී.ලිවේරිස් අමරතුංග | 6502.50 |
| 125 | කේ.ඒ.ආර්.මධුසංඛ | 5000.00 |
| 126 | තෝමස් මනුෆැක්චරින් පු.ලිමිටඩ් | 372844.23 |
| 127 | ඊ.එස්.සෝමපාල | 21718.00 |
| 128 | මහේෂි මාකටිං පු.ලිමිටඩ් | 20199.00 |
| 129 | සුදු අරලිය මාකටිං පු.ලිමිටඩ් | 41797.01 |
| | | 10054484.82 |

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි අතුරු ප්‍රශ්න තුනක් අහන්න අවසර. ගරු ඇමතිතුමා කිව්වා, මේ පරීක්ෂණ නිලධාරියා එළවලා නැහැයි කියලා. එළවලා නැත්නම් ඒ පරීක්ෂණ නිලධාරියාට වෙච්ච දේ? මම දන්න විධියට දැනට පරීක්ෂණ නිලධාරියෙක් නැහැ. ඒ එක්කම කුමන කෙනෙක් හරහා දැනට සමුපකාර දෙපාර්තමේන්තුව ඒ සමිතිය පිළිබඳ පරීක්ෂණ, එහෙම නැත්නම් අධීක්ෂණ කටයුතු කරනවාද කියන කාරණාව. ඒ එක්කම මෙච්චර අයිරාවක් වැඩිවෙලා තියෙද්දී ඔබතුමා පිළිගන්නවාද මේ සමිතියේ සභාපතිවරු භාරගත්තට පස්සේ, මේ ආයතනය යම් පමණකට කළමනාකරණයේ දුර්වල වෙලා අදක්ෂ තත්ත්වයට පත්වෙලා වැටෙන තත්ත්වයකට පත්වෙමින් තියෙනවා ද කියන කාරණාව.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මෙම සමුපාකාර සමිතියේ ඡන්දය තියලා අධ්‍යක්ෂ මණ්ඩලය තේරෙන කොට, කලින් හිටපු අධ්‍යක්ෂ මණ්ඩලයේ කාලයේ මිලියන ලක්ෂ තුන්දාස් තුන්සීය පනස්ගානක හිහයක් තිබුණා. එතකොට ඒ හිහයක් එක්ක තමයි මේ අළුත් අධ්‍යක්ෂ මණ්ඩලය ණය වාරික අරන් අළුතෙන් බඩු දාලා ඔක්කොම කරලා මේක දියුණු කරන්න කටයුතු කරලා තියෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පරීක්ෂණ නිලධාරින් මෙහෙම (බාධා කිරීමක්) සමුපකාර සමිතියේ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පරීක්ෂණ නිලධාරිවරයෙක් එහෙම දෙයක් අපිටවත් අපේ දෙපාර්තමේන්තු නිලධාරියෙකුටවත් අපේ කොමසාරිස් වරයාටවත් මටවත් දැනුම් දීමක් කරලා නැහැ. පොලිසියට කිසිම පැමිණිල්ලක් නැහැ. එතකොට අපි කොහොමද දැනගන්නේ? අපිට එහෙම පැමිණිලි ඇවිත් නැහැ. ඒ නිසා තමයි අපි මේ පරීක්ෂණය කළාම එහෙම දෙයක් වෙලා නැහැයි කියලා කියලා තියෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පරීක්ෂණ නිලධාරියා යන්නේ නැත්නම් ඔබතුමා ඇමතිවරයා විධියට හොයලා බලන්න එපායැ ඇයි යන්නේ නැත්තේ කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

(බාධා කිරීමක්) යන්නේ නැත්නම් ඒකට මම තීරණයක් ගන්න, කොමසාරිස්වරයාට උපදෙස් දෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැන් අවුරුදු එකහමාරක් වෙනවා කිසි තීරණයක් අරන් නැහැ. කිසි තීරණයක් අරන් නැහැ. එයා ගෙදරට වෙලා ඉන්නවා. සමිතිය යනවා ඔහේ යන්නම් වාලේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මෙහෙම යන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පරීක්ෂණ නිලධාරියා යනවා ද නැද්ද කියලා මට වාර්තා වෙලා නැහැ. එයාගේ නමට වාර්තාව දෙන්න ඕනැ. මට එහෙම පැමිණිල්ලක් දීලා තියෙනවා නම් මම ඒ ගැන තීරණයක් ගන්න කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, මම බෙහෙවින් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, කැලණිය ප්‍රාදේශීය සභාවේ පරිපාලනය අවුල් වී මන්ත්‍රීවරුන්ගේ අභිමානයට, ස්වාධීනත්වයට දිගින් දිගටම

තර්ජනය වෙමින් මන්ත්‍රීවරයෙකු ළඟදී ඝාතනය වීම සම්බන්ධව කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. බස්නාහිර පළාත් සභාවට නිරන්තර වගකීමක් යුතුකමක් තියෙනවා මේ පිළිබඳ එක්තරා විධියට මැදිහත් වෙන්න. කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී හසිත මඩවල මැතිතුමා පසුගියදා තුවක්කුකරුවෙකු විසින් ඝාතනය කළා. කැලණිය ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති සීවලී කැලණිතිලක මැතිතුමාත්, සරත් ඩයස් මැතිතුමාත් අවුරුදු දෙකක කාලය තුළ මේ ජීවිත තුනම මහජන ඡන්දයෙන් පත් වුණ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් තමයි රජමහ කැලණියේ ජනතාවට අහිමි වුණේ. මේ හසිත මඩවල මන්ත්‍රීතුමාගේ ඝාතනය, පැහැදිලිවම ඝාතනයක්. මිනී මැරුමක්. අනික් මන්ත්‍රීවරු දෙදෙනා නොමරා මැරීමක්. මේ උප සංස්කෘතියක් තුළින් බිහිවුණු කාලකණ්ණි දේශපාලන සංස්කෘතියක් තමයි රටට හඳුන්වා දී තිබෙන්නේ. මෙන්න මේකයි අපි හෙළා දකින්නේ. මේ මිතුරු ලෙසින් පොල් කොළ සර්පයෝ වගේ කරන නිහීන වැඩ. A ද B ද C ද මේ දේ කරන එක නොවෙයි වැදගත්. අපට වැදගත් කැලණියේ ඉපදුණු කෙනෙක් හැටියට, 1991 ඉඳලා මහජන මන්ත්‍රීවරයෙක් ලෙස ඉන්න කෙනෙක් හැටියට නිරන්තර වගකීමක් තියෙනවා. මම ජීවත්වන ගමේ හිටපු මන්ත්‍රීතුමාව තමයි අමු අමුවේ මරලා දැම්මේ. මේ සිද්ධිය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ඊයේ ඇවිල්ලා ඒ ජනතාව සමග තමන්ගේ ශෝකය ප්‍රකාශ කරලා අද උදේ මට කථා කරලා කිව්වා, රෙහෙන්සිරි මන්ත්‍රීතුමා තමුන්නාන්සේගේ ගමේ මන්ත්‍රීවරයා ඝාතනය කරපු සැකකරුවා අත්අඩංගුවට ගත්තා කියලා. මම ඉතාමත් සතුටු වෙනවා, එතුමා ඊයේ පැමිණීම පිළිබඳව. ඒ ප්‍රකාශය කිරීම පිළිබඳව. අද රටේ -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

කාගේ සම්බන්ධීකරණ ලේකම්ද කියලත් කියන්න.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

කාගේ සම්බන්ධීකරණ ලේකම්ද කියලා මට තාම හරියට නිශ්චිතව කියන්න බැහැ. දැන ගන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

නම කියන්න.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඉන්න කෝ පොඩ්ඩක්. කථා කරන්න දෙන්න කෝ. ඒ සිද්ධිය තුළින් රටේ ජනතාව, (බාධා කිරීමක්) ඔබතුමාගේ කථාවේදී ඔබතුමා කියන්න. ඒ සිද්ධිය තුළින් සිදු වෙන්නේ, මේ රටේ විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන, ජනතා බලය ගැන කථා කරන යුගයක, පරමාධිපත්‍ය ගැන කථා කරන යුගයක කැලණියේ අපි මෙය නිර්දය ලෙස හෙළා දකිමින් සැබෑ මිනී මරුවෝ, සැබෑ සැකකරුවෝ හඳුන්වලා දෙන්න කියන ඉල්ලීම කරමින් නිහඬ වෙනවා. තමුන්නාන්සේට බෙහෙවින් ස්තුති වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ කැලණියේ මැර දේශපාලනය ආණ්ඩු පක්ෂයට නොවෙයි විපක්ෂයට තිබුණේ. ප්‍රාදේශීය සභා මැතිවරණයේදීත්, පළාත් සභා මැතිවරණයේදීත් නැත්නම් මහ මැතිවරණයක්, ජනාධිපතිවරණයේදීත්. මමත් මේකට අහුවුණ මන්ත්‍රී කෙනෙක් වශයෙන් හිරේ ගියා. වෙඩි කෑවා. පොලීසිවල ටොයිලට් අස්සේ රිංගුවා. වෙන්න ඕනෑ දේවල් වුණා. අද ආණ්ඩු පක්ෂයට මේක වෙලා තියෙනවා. මේ හසිත මඩවල මන්ත්‍රීතුමා ගැන කථා කරනවා නම්, අද රෙහෙන්සිරි වරාගොඩ ගරු මන්ත්‍රීතුමාගෙන් බරපතළ ප්‍රකාශයක් කියැවුණා. අතිගරු ජනාධිපතිතුමා අද උදේ දුරකථනයෙන් කථා කරලා සැකකරුවෝ අල්ලගත්තා කියලා කිව්වා කියලා. ඉතින් මේ කහ නැටටෙක්ද නැත්නම් කුඩු කාරයෙක්ද කියලා අපි දන්නේ නැහැ. මේකේ ඇත්ත එළි කරන්න ඕනෑ. මේක තමයි අවශ්‍ය දේ. මේ කැලණිය තියෙන භීෂණය සම්බන්ධව, අල්ලස් හා දූෂණය සම්බන්ධව මම දිගින් දිගටම කථා කරපු මන්ත්‍රී කෙනෙක්. අද තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. අද මෙතුමා දීර්ඝ වශයෙන් මාධ්‍යයට ප්‍රකාශ කළා. මාධ්‍යයට ඒ සම්බන්ධව කථා කළා. මෙතුමා ඒ සම්බන්ධව හසිත මඩවල මැතිතුමා අදාළ මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න, නැත්නම් වගකිව යුත්තෝ කවුද කියලා ප්‍රකාශ කළා. එහෙත් අද මේ කැලණිය පොලීසියෙනුත්, පෑලියගොඩ පොලීසියෙනුත්, කිරිබත්ගොඩ පොලීසියත් සාධාරණය ඉෂ්ට වෙන්නේ නැහැ කියන්නේ අපි නොවෙයි. කැලණියේ ඉන්න මහජන නියෝජිතයෝම තමයි කියන්නේ. මේකයි යථාර්ථය. මෙයයි අද කැලණිය තත්තවය. අපි දැක්කා, ඊයේ රූපවාහිනියෙන්, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ආපු ගමන් දණ ගාගෙන, වැඳගෙන කෑගහපු දේවල්. අපි ඒවා දැක්කා. කියන්න නෑ නැහැ. මේක තමයි ඇත්ත දේ. ඇත්තටම වගකියන්න නෑ ජනාධිපතිතුමා. වෙන කවුරුවත් නොවෙයි. ජනාධිපතිතුමා වග කියන්න ඕනෑ. මේක තමයි ඇත්ත දේ. එම නිසා -

[සභාවේ ඝෝෂා]

මම ඉල්ලීමක් කරන්නේ මේ සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් කරලා බුදුන් වැඩිය කැලණියේ, රජමහා විහාරය තියෙන කැලණියේ, විභීෂණ දෙවියන්ගේ අඩවියේ, මේ සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. මේ සාධාරණය ඉෂ්ට කරන්න කියන ඉල්ලීම කරමින් එදා වගේ පළාත් සභාවේ හැමදාම මම ප්‍රකාශ කරනවා මේ සම්බන්ධව වග කියන්න ඕනෑ ජනාධිපතිතුමා. වෙන කවුරුත් නොවෙයි. ජනාධිපතිතුමා වැඩ කළාද මේ භීෂණය සම්බන්ධව.

[සභාවේ ඝෝෂා]

මම ඒක විවෘතව ප්‍රකාශ කරනවා. විපක්ෂයේ සංවිධායක වශයෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය දුන්නේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කමක් නැහැ මම සහාගත කරනවා. මම සහාගත කරනවා. එච්චරයි. මේ එදා සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාටත් මහ මැතිවරණය වෙලාවේදී නිදහසේ ඡන්දය ඉල්ලන්න බැරුව ගියා. එතුමාගේ ප්‍රතිඵලය විකෘති කළා. අපි විවෘතව ප්‍රකාශ කරන්න ඕනෑ. මෙතුමා චන්ඩියෙක් වගේ කථා කළාට, මෙතුමා වීරයෙක් වගේ කථා කළාට රෙහෙන්සිරි මන්ත්‍රීතුමා ඔබතුමාටත් කැලණියේ ඇවිදින්න පුළුවන්ද? ඇත්ත කථා කරන්න. භයේ ඉන්නේ නීතිය කථා කළාට මේක තමයි ඇත්ත තත්ත්වය. එහෙනම් මේ සම්බන්ධව පරීක්ෂණයක් කරලා හසිත මඩවල මැතිතුමාට අපේ සහෝදර මහජන සේවකයෙක්, එතුමාට අපේ විපක්ෂයේම ශෝකය ප්‍රකාශ කරනවා වගේම එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ඉතාමත් ස්තුති කරනවා මගේ මේ කනගාටුදායක ප්‍රකාශය කරන්න අවස්ථාවදීම සම්බන්ධව. 06/01/2013 දින උදේ 10.28 ට පමණ මගේ ද්විත්ව ජංගම දුරකථන අංක සහිත එනම්, 0777750000 සහ 0777803737 දරණ දුරකථනයට අංක 0115692012 යන දුරකථනයෙන් ඇමතුමක් ලැබුණා. එයින් කථා කළ පුද්ගලයා කීවේ තමා ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් බවත්, දැනට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 89041 දරණ නඩුවේ වරද පිළිගෙන ඊළග නඩු වාරයේ, එනම් 2013.01.30 වන දින නඩුව අවසන් කරගත යුතු බවත්, එසේ නොකළහොත් ආයෙමත් නඩුවට ඒමට ඉඩ නොතබන බවටත් මරණීය තර්ජනය කළා. මීට හේතුව ඔහුගේ මිතුරෙකු වන අසාද් සාලි - හිටපු නියෝජ්‍ය නගරාධිපති විසින් මීට වසර හතකට පමණ පෙර මා සමග කළ වාහන ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ ඉහත නඩුව, පැමිණිල්ලට බරපතළ ලෙස සහ අවාසිදායක තත්ත්වයක පවතින නිසයි. මා කීවේ වරද පිළිගැනීමට නොහැකි බවත්, මෙම බොරු නඩුවෙන් මා නිදහස් වන බවත්ය. වැල්ලවත්ත වංචා විමර්ශන පොලිස් ස්ථානයේ ප්‍රධානියා ලෙස එවකට කටයුතු කළ ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් තම අංශයේ පහළ නිලධාරීන් මෙම නඩුවට අදාළ සිද්ධිය අවුරුදු 05 කට වඩා පරණ බැවින්ද, මෙය සම්පූර්ණයෙන්ම සිවිල් ආරවුලක් බැවින්ද, මෙම නඩුව පැවරිය නොහැකි බවටත් ප්‍රකාශ කළත්, ඔවුන්ට බලපෑම් කර තම මිතුරා වන අසාද් සාලි, එනම් හිටපු නියෝජ්‍ය නගරාධිපතිගේ කීමට මගෙන් දේශපාලන වශයෙන් පළිගැනීමක් සඳහා ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර්ගේ උවමනාව මත මෙම නඩුව පැවරුවා. දැන් ඔවුන්ට මෙම නඩුව තව දුරටත් ගෙන යාමෙන් මා නිදහස් වන බව දන්නා නිසා, මෙසේ වරද පිළිගන්නා ලෙස මට මරණ තර්ජනය කරනවා. මීට පෙර අවස්ථා දෙකකදී එනම්, CIB II 306/77 දිනය 2012.07.10 වන දින සහ CIB I 108/17 දිනය 2012.07.03 වන දින යන පැමිණිලි මා විසින් බම්බලපිටියේ පොලිස් ස්ථානයට සිදු කරන ලද්දේ, ඉහත කී පොලිස් ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් නැමැති පොලිස් නිලධාරියාගේ මේ ආකාරයටම මා හට මරණ තර්ජනය කිරීම සම්බන්ධයෙනි.

මා විසින් මීට පෙර එකී ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් නැමැති නිලධාරියාට විරුද්ධව ඉහත කී 89041 දරණ ව්‍යාජ නඩුව නීති විරෝධී ලෙස පැවරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට අංක HRC/3520/10/1-VIII යන පැමිණිලි කළා. එහිදී එම පැමිණිල්ල කළ නිලධාරීන් මා හට කීවේ ඔබට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බැවින් මේ පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉක්මණින් නඩුව පවරන ලෙසය. මේ ගැන මට දැනුමක් තිබුණේ නැත. ඒ සම්බන්ධයෙන් මා හට එහි සිටි නිලධාරීන් වන අරම්පත්, සුලාරි ලියනගම සහ මොහොමඩ් ෆවුමි යන අය කීවේ ඔවුන් හඳුනන හොඳ නීතිඥ මහත්තයෙක් වන ජේ.එම්.විජේබණ්ඩා මහතා හමුවන ලෙසයි. ඒ අනුව මා පිටකෝට්ටේ පිහිටි ඔහුගේ නිවසට ගොස් එම නිතිඥ මහතා හමු වුණා. ඔහු කීවේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව නීති විරෝධී ලෙස පවරා ඇති බවත්, ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් සහ අසාද් සාලි යන දෙදෙනාට එරෙහි මානව හිමිකම් නඩුවක් සහ තවත් නඩුවක් පැවරීම සඳහා තමාට ලක්ෂ 04 ක ගාස්තුවක් ගෙවන ලෙසය. ඒ අනුව වරින් වර HNB චෙක් සහ මුදලින් රුපියල් ලක්ෂ 04 ක් දුන්නා. ඒ අනුව මටවත් නොදන්වා ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් නඩුවක්, නඩු අංකය FR28/2011 යටතේ පවරා ඇති අතර එම නඩුව නිෂ්ප්‍රභා කළ බව පසුව දැනගන්න ලැබුණා. ජේ.එම්. විජේබණ්ඩාර නීතිඥ මහතා මට මේ ගැන දැනුම් දුන්නේ නැත. පසුව සොයා බලන විට මේ සියල්ල කුමන්ත්‍රණයක් බව මට වැටහුනා. එනම් මානව කොමිසන් සභාවේ ඉහත කී නිලධාරීන් සහ ජේ.එම්. විජේබණ්ඩාර නීතිඥ මහත්තයා ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් මහතාගේ ළගම හිතවතුන් බවය. මානව හිමිකම් නඩුව නිෂ්ප්‍රභා වුවත් ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් මහතාගේ වෛරය නතර වී නොමැත. ඔහුගේ මෙම මරණ තර්ජනය සහිත දුරකථන ඇමතුම නිසා මා හට මාගේ ජීවිත ආරක්ෂාව පිළිබඳ බලවත් ගැටළුවක් වී ඇත. මා හට යම් කරදරයක් වුවහොත් ජ්‍යෝෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් වගකිව යුතුය. බම්බලපිටිය පොලිසියේ පොලිස් නිලධාරී මේ සම්බන්ධයෙන් කර ඇති පැමිණිලි විභාග නොකරන ලද්දේ

ජ්‍යෙෂ්ට පොලිස් අධිකාරී මැක්සි ප්‍රොක්ටර් නිලධාරිගේ බලපෑම් මතය. මෙම පොලිස් නිලධාරියාට දැනටමත් අපරාධ පරීක්ෂ දෙපාර්තමේන්තුවේත්, විශේෂ අපරාධ අංශයේත්, CID CSIU UNIT 2 362/2011/CM සහ SIU/182/2010 ගොනු අංකය යටතේ පරීක්ෂණ පවතින බවත්, ඒවාත් ඔහුගේ නිල බලය පාවිච්චි කර යට ගසා ඇති බවත් දැන ගැනීමට ඇත. මෙයින් මාගේ මන්ත්‍රී වරප්‍රසාද උල්ලංඝණය වන බැවින් ගරු ආරක්ෂක ලේකම්තුමාට සහ පොලිස්පතිතුමාට මේ පිළිබඳ දැනුම් දී ඒ අනුව මෙම පැමිණිල්ල විභාග කර, ඔහුට එරෙහිව විනයානුකුල පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමි. මීට අදාළ සියළු ලිපි ලේඛන සභාගත කිරීමට ඔබතුමාගෙන් අවසරය පතමි. තවද අවසන් වශයෙන් මා ඉල්ලා සිටින්නේ, පසුගිය කාලය තුළ මෙවැනි තර්ජන නිසා අප සභාවේ මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම ජීවිතක්ෂයට පත් වූ බවත්, පසුගිය දා කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී හසිත මඩවල මහතා වෙඩි තබා ඝාතනය කිරීමද සැලකිල්ලට ගෙන මාගේ ආරක්ෂාව සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙසය. මම මෙම සියලු ලිපි ලේඛන සභාගත කරනවා.[2]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා සභාගත කරන්න. කාලය අවසන් ඔබතුමා වාඩි වෙන්න. එතුමා විසින් බොහොම බරපතළ ප්‍රකාශයක් කළේ. එතුමාගේ ජීවිතය සම්බන්ධව ඇති බලපෑම් පිළිබඳව. මම මෙම අවස්ථාවේදී එම ප්‍රකාශය පිළිබඳව ආරක්ෂක ලේකම්තුමාටත්, පොලිස්පතිතුමාටත් මේ පිළිබඳව වහාම දැනුම් දීලා එතුමාට අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට කටයුතු කරන ලෙස සභා ලේකම්තුමාට උපදෙස් දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඊට අදාළව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා ඇයි? වාඩි වෙන්න ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

වරප්‍රසාද ප්‍රශ්නයක්. අපි ඔක්කොටම හරි වැදගත්. ඊළග සභා වාරයේදී ඔබතුමා මේ ගැන විමසලා සභාවට ප්‍රකාශයක් කරන්න. මොකද අපේ සභා මන්ත්‍රීවරයෙකුට පොලිස් නිලධාරියෙකුගෙන් මරණ තර්ජන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මේක බරපතල ප්‍රකාශයක්. මම ඒකයි කිව්වේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ නිසා නිකන් ඉන්න එපා. ඊළග සභා වාරයේදී ඔබතුමා වාර්තාවක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

මට ආරක්‍ෂාවත් ලබා දෙන්න කියනවා. මේ නඩුවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රකාශය අපි ආරක්‍ෂක ලේකම්තුමාට යොමු කරනවා. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා, හොරණ තක්ෂිලා විද්‍යාලය පිළිබඳව කාරණා ඉදිරිපත් කිරීමට.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, හොරණ අප පළාත් සභාවට අයත් තක්ෂිලා මහ විද්‍යාලයේ කණිෂ්ට පාසලක් හැටියට අවුරුදු ගණක් තිස්සේ කුළුපන විද්‍යාලය නම් කරලා තිබුණා. ඒ කාලය තුළ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. එතුමාගේ ප්‍රකාශය ඇහෙන්නේ නැහැ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

විශාල ශිෂ්‍ය පිරිසක් මේ පාසල -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික සාකච්ඡා කරුණාකර නතර කරන්න. අපේ ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීතුමා, වනිගරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

සභාවට අවධානය යොමු කරන්න. අනික් පැත්ත හැරිලා ඉන්නේ. ඔබතුමා ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවට අයත් පාසලක් හැටියට තක්ෂිලා මහ විද්‍යාලය අනුබද්ධ ප්‍රාථමික පාසලක් හැටියට පවත්වාගෙන ගිය කුළුපන මහ විද්‍යාලයේ පහ වසර සමත් වුණු දරුවන් තක්ෂිලා මහ විද්‍යාලයට ඇතුළත් කර නොගැනීමට තීරණය කර තිබෙනවා. මේ නිසා පාසලේ ශිෂ්‍යයින්ට වාගේම දෙමව්පියන්ට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා වාගේම පාසලේ අවට දෙමව්පියන් පිරිලා විශාල උද්ඝෝෂණ කරන තත්ත්වයට පත් වුණා. මේ තත්ත්වය දිගින් දිගටම පවත්වාගෙන යනවා. අද වනතුරු මේ ප්‍රශ්නය විසඳිලා නැහැ. මේ අවස්ථාවේ මම කැමැති වෙනවා, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා සිටියා නම් මේ ප්‍රශ්නය ගැන කියන්න. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මහජනතාවට විශාල හිරිහැරයක් වෙලා තිබෙන, ඒ වාගේම විශාල අසාධාරණයක්. පහ වසර දක්වා ගිය ශිෂ්‍යයින්ට පාසලක් නැහැ. තක්ෂිලා පාසලේ ප්‍රාථමික විද්‍යාලය නාම පුවරුව බෝඩ් එකේ ගහලා තිබෙනවා. ඉස්සෙල්ලා හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා උත්සවයක් තියලා ඉන්දැද්දී ඒක විවෘත කිරීමක් කළා. පහ වසරෙන් පස්සේ තක්ෂිලා විද්‍යාලයට මේ ළමයින් ගන්න පොරොන්දුවක් වුණා. ඒ අනුව දෙමව්පියන් විශාල පිරිසක් තක්ෂිලා විද්‍යාලයේ ප්‍රාථමික පාසල හැටියට දැකලා එම පාසලට ළමයින් ඇතුළත් කළා. තක්ෂිලා මහ විද්‍යාලය කියන්නේ කළුතර දිස්ත්‍රික්කයේ කීර්තිමත් පාසලක්. ඒ වාගේම කුළුපන කණිෂ්ඨ විද්‍යාලයේත් අධ්‍යාපන තත්ත්වය නඟා සිටුවන්න පුළුවන්කම ලැබුණා, මෙය අනුබද්ධ කිරීම තුළින්. නමුත් අද ඒ තත්ත්වය ක්‍රියාත්මක කරන්නේ නැති නිසා දරුවන්ට හා දෙමව්පියන්ට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරලා මේ ශිෂ්‍යයින්ව නැවත වරක් මේ වර්ෂය තුළ තක්ෂිලා මහ විද්‍යාලයට ඇතුළත් කර ගන්නත්, ඉදිරියේදී සෑම වසරකම අනුබද්ධ පාසලක් හැටියට මෙය පවත්වාගෙන යාමට ක්‍රියාත්මක කරන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ ඔබතුමා ඉදිරිපත් කරපු කාරණා පිළිබඳව මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන ඇමැතිතුමා නොසිටියත් නිලධාරීන් සිටින ස්ථානයේ සහකාර ලේකම්තුමා ඉන්නවා. එතුමා අවශ්‍ය කටයුතු ගරු ප්‍රධාන අමාත්‍යතුමා එක්ක සාකච්ඡා කර කඩිනම්ව එතුමාගේ ඉල්ලීමට සාධාරණත්වය ඉෂ්ට කර දේවි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් මේ ප්‍රකාශය කරන්න උත්සාහ කළේ කරදියාන කැළි කසළ බහාලන මධ්‍යස්ථානයේ ජනවාරි 01 වැනිදා සිදු වුණු ඒ ඛේදවාචකය පිළිබඳව කථා කරමින් ඉදිරියේදී එවැනි සිදුවීමක් සිදු නොවීමට වගබලා ගන්නා ආකාරය පිළිබඳව කථා කරන්නයි. නමුත් අද ප්‍රධාන අමාත්‍යතුමා නොසිටියත් - ගරු සභාපතිතුමනි, ජනවාරි 01 වැනිදා කරදියාන කැළි කසළ බහාලන ස්ථානයේ සේවකයෙක් යන්ත්‍රයක අත්තක් වැදිලා මිය ගියා. ඉතාම දරුණු ඛේදවාචකයක් එම ස්ථානයේ සිදු වුණා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ ගරු සභාපතිතුමනි, ඒ සේවකයාගේ බිරිඳට රැකියාවක් ලබාදෙන්නත්, බස්නාහිර පළාත් සභාවේ ජන රැළි (බාධා කිරීමක්) ඒකකය ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව දන්වලා තියෙනවා. දරුවන්ටත් සහන දෙන්න කතා කරලා තියෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, මෙතැන තියෙන මූලික ප්‍රශ්නය තමයි මෙවැනි ස්ථානයක පන්සීයක් හයසීයක් සේවකයෝ සේවය කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, ආරක්ෂාව පිළිබඳව කිසිදු පියවරක් මේ ස්ථානයේ අරගෙන නැහැ. විශේෂයෙන්ම සේවකයන්ට රක්ෂණ ක්‍රමයක් නැහැ. එම ස්ථාන ඇතුළත දී යම් අනතුරකට ලක්වුණොත් ඔවුන් පිළිබඳව ගෙවීම් කළ යුත්තේ කොහොමද කියලා ක්‍රමවේදයක් නැහැ. දැන් මේ බැකෝ යන්ත්‍රයක පියනක් වැරැදියට වෙන පැත්තකට රිවස් කිරීමේදී ඔළුවේ වැදීමෙන් තමයි එතැන වැඩ කරපු මේ සේවකයා මිය ගියේ. ඒ නිසා මේ ස්ථානයේ කැළි කසළ වෙන් කරමින් හඳුනා ගැනීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් මෙතැන එම ප්‍රදේශයේ ජනතාව තුන් හාරසීයක් චක්‍රව ආදායම් ලබනවා. නමුත් මෙම ස්ථාන ඇතුලේ සේවකයෙක්. ඔහු කුඩා සේවකයෙක් නිසා උදව්වක් කරන්න හම්බ වුණත්, සාමාන්‍ය සේවකයෙකුට පවා මේ ස්ථානයේ දී මෙවැනි අනතුරුවලට ලක්වෙන්න පුළුවන්. ඒ නිසා ඉදිරියේදී විදුලිය ද නිෂ්පාදනය කිරීමේ ක්‍රියාදාමයකට මේ කරදියාන කැළි කසළ ස්ථානය පාවිච්චි කිරීමට කටයුතු කරන නිසා ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, ඉතාමත්ම ඉක්මනින් කැළි කසළ අපද්‍රව්‍ය අධිකාරිය මේ පිළිබඳව අවධානය යොමු කරලා, මේ ස්ථානවල සේවකයින්ගේ ආරක්ෂාව අංක එකට පත් කරලා, මේ පිළිබඳව රක්ෂණ ක්‍රමවේදයක්, මෙම ස්ථානය ඇතුළත මේ කරදියාන මධ්‍යස්ථානය ඇතුළත විතරක් නොවෙයි. මේ වගේ කැළි කසළ ස්ථාන තුනක් මේ වන කොට බස්නාහිර පළාතේ හඳුනාගෙන තියෙනවා. මේවා ඇතුළතදී යම් සේවකයෙකුට අනතුරක් වුණොත් රක්ෂණ මුදලක් ගෙවීමේ ක්‍රමවේදයක් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා මෙය ප්‍රධාන අමාත්‍යවරයාට යොමු කරලා, ලබන සතියේ ඉඳලා විශේෂයෙන්ම මෙය අත්‍යවශ්‍ය රාජකාරියක් සේ සලකලා මේ සඳහා අවශ්‍ය පියවර ගන්න ගරු ප්‍රධාන අමාත්‍යවරයාට යොමු කිරීමට තමයි මම මේ ප්‍රකාශනය කරන්නේ. ඒ නිසා ඔබතුමා මාර්ගයෙන් යොමු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ ප්‍රකාශය මම හිතන්නේ, ඉතා වැදගත් ප්‍රකාශයක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් සහභාගි වී සිටින නිලධාරි මහත්වරුන් ඒ පිළිබඳව එතුමාව දැනුවත් කර ඒ පිළිබඳව කඩිනම් සාධාරණත්වයක් ඉෂ්ට කරන්න.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ගරු සභාපතිතුමනි, කැලණි ප්‍රාදේශිය සභාවේ අපේ හිතවත් මන්ත්‍රී හසිත මඩවල සහෝදරයාගේ අභාවය පිළිබඳව අපි බරපතළ කම්පනයකට ලක් වෙලා තියෙනවා. ඒ වාගේම ඒ කෲර ඝාතනය, ම්ලේච්ඡ ඝාතනය අපි තරයේ හෙළා දකිනවා. කැලණි ප්‍රදේශය පහුගිය කාල පරිච්ඡේදය තුළ මහා කළු පැල්ලම් සහිත ප්‍රදේශයක් බවට පරිවර්තනය වෙලා තියෙන බව අප සියලු දෙනා දන්නවා. මේ අවාසනාවන්ත තත්ත්වය පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ දී අපි කැලණි ජනතාවට කිව්වා. කැලණි ප්‍රදේශය නියෝජනය කරන වැඩිම ඡන්ද ගත් මන්ත්‍රීවරයා විධියටත්, ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රදේශය නියෝජනය කරමින් මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා බවට පත් නොවුණත් ඇත්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා බවට පත් වෙන්න ඒ ශක්තිය තිබුණ තැනැත්තා විධියටත් අපි ඉතාම ඕනෑ කමින් පසුගිය කාල පරිච්ඡේදය තුළ කැලණි ප්‍රදේශයේ ඇති වුණු අවාසනාවන්ත තත්ත්වය අපි හෙළිදරව් කළා.

හසිත මඩවල මහතා කැලණි ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක මර්වින් සිල්වා අමාත්‍යතුමාත් එක්ක, මැතිතුමා සමග මැතිවරණ කාලපරිච්ඡේදයේ එතුමා කැලණියට ආවට පස්සේ කිට්ටු සම්බන්ධතා පැවැත් වූ බව අපි දන්නවා. හැබැයි, කැලණි ප්‍රදේශ තුළ සිදුවන, දිගින් දිගට සිදුවන හිරිහැර, වංචා, කප්පම් ගැනීම්, පහරදීම් මේ සියලු කාරණාවලට එරෙහිව අවසාන අවස්ථාවේ කැලණි ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරු එකොලොස් දෙනෙක් සමහත්, පැළියගොඩ නගර සභාවේ මන්ත්‍රීවරු තිදෙනෙකු සමහත් එකට එකතු වෙලා දිගින් දිගටම මේ කරුණු පිළිබඳව මහජනතාවත්, රටේ වගකිවයුත්තන්ටත් දැනුවත් කිරීම සිදු කළ බව අපි ඉතා ඕනෑකමින් කියනවා. ඒ දැනුවත් කිරීමට කරන්න අවශ්‍ය ශක්තිය, පෞරුෂත්වය, නිර්භීතකම, එඩිතරකම මඩවල මන්ත්‍රීතුමා සතුව තිබුණා. ඒ නිසා ඒ ශක්තියට අපි ගරු කරනවා. ඔහුගේ ජීවිත අවසාන වශයෙන් පූජා කරලා මේ යථාර්ථය තෝරා දෙන්න අවශ්‍ය කටයුතු අද වන විට සිදු වෙලා තිබීම මහා කනගාටුදායක තත්ත්වයක් ලෙස අපි මතක් කරනවා.

විශේෂයෙන්ම පහුගිය අයවැය විවාදයේදීත්, ඊට පෙරත් කැලණි ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරුන්ට සිදුවන හිරිහැර පිළිබඳව මේ සභාවේ අපි ඔබතුමා ඉදිරියේ ප්‍රකාශ කර බව කවුරුත් දන්නවා. අසත්‍ය, වැරැදි, අභූත චෝදනා මත මන්ත්‍රීවරුන්ව දිගින් දිගටමත් අත් අඩංගුවට ගනිද්දී, - ඇතැම් මන්ත්‍රීවරුන්ට අසධ්‍ය චෝදනා මත නඩු පහයි හයයි. ඔවුන් හැමදාම හිර භාරයේ.. අපි දන්නවා. මේ මන්ත්‍රීවරු සල්ලි හම්බ කරලා තිබුණේ නැහැ. ඇත්තටම නීතිඥවරයෙකුට ගාස්තු ගෙවා ගන්න විධියක් නැහැ. මම හෘද සාක්ෂියට අනුව. කථා කරන්නේ. හදවතට එකඟව කථා කරන්නේ. ඒ අසරණ වුණු මන්ත්‍රීවරුන්ව ඇප පිට නිදහස් කර ගන්න අපි එක මොහොතක දී මහර කඩවත උසාවියේ නීතිඥවරු හතලිහක් නැගිට්ටවලා තමයි අපි කථා කෙරුවේ. මඩවල සහෝදරයාව ඇප දීලා බේරා ගත්තෙත් ඒ විධියට. ඒ නිසා මේ අවාසනාවන්ත තත්ත්වය, ලකුණු දාගන්න, මූහුණ පෙන්නන සෝබන දේශපාලනය නොවෙයි. මේ අවාසනාවන්ත තත්ත්වය තවදුරටත් කැලණිය තුළ සිදුවන්න ඉඩ දිය යුත්තේ නැහැ. අවසාන වශයෙන් අපේ මරණයත් ඇතැම් වෙලාවට සිද්ධ වෙන්න ඉඩකඩ තියෙනවා. එතරම් බිහිසුණු සහ අකාරුණික තත්ත්වයක්. ඒ අත්දැකීම් අපි පාර්ලිමේන්තු මැතිවරණය තුළ වින්දා. පරාජයේ වගකීම් භාර ගත්තේ ඒ ජීවිත. අපත් එක්ක සිටි මිනිසුන්ගේ ජීවිත බේරා ගන්නත් එක්ක. ඒ නිසා අපි ඉතාම ඕනෑකමින් කියනවා. මේ අවාසනාවන්ත තත්ත්වය නැති කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම වගකිව යුත්තන්ට කරමින්, මේවා ලෝක ධර්මය විසින් - මම වෙන කිසිම කෙනෙකුට භාර කරන්නේ නැහැ. ලෝක ධර්මය විසින් මේ සත්‍ය වෙනුවෙන් කටයුතු කරයි කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.35 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 11.35 a.m. and then resumed.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## ආර්ථික හැකියාවක් නොමැති පවුල්වල දරුවන් සඳහා සහන සැලසීම
PROVIDING RELIEF TO CHILDREN OF ECONOMICALLY DISABLED FAMILIES

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, 2013 වසරේ ආරම්භක පළාත් සභා රැස්වීමේදී මාගේ මුල්ම යෝජනාව මට ඉදිරිපත් කිරීමට ලැබීම මම හිතන්නේ මා ලැබූ වාසනාවක් කියලා මම හිතනවා. ඒ නිසා

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී එම යෝජනාව ඉදිරිපත් කරනවා.

*"වර්තමානයේ බස්නාහිර පළාතෙහි පාසල් භෞතික හා මානව සම්පත් වලින් බොහෝ දුරට අංග සම්පූර්ණ වී ඇත. අද පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සියලුම පාසල්වල ගුරු හිඟය අවම කර මනා ගුරු තුලනයක් පවත්වා ගෙන යාම සතුටට කරුණකි. එමෙන්ම භෞතික සංවර්ධනය සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදනද සතුටුදායක මට්ටමක පවතී.*

*නමුත්, අද අප සමාජය තුළ ආර්ථික වශයෙන් හැකියාවක් නොමැති, පවුල් වල දරු දැරියන්ගේ අධ්‍යාපන මානසිකත්වය වැඩි දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කළ යුතුව ඇත. මන්ද යත්, එම දරුවන්ගේ පවුල්වල ආර්ථික පීඩනය මත එම දරුවා පාසලට පැමිණීමේ ප්‍රවනතාවය අඩුවන අවස්ථා ඇත. එම දරුවාට අනිකුත් දරුවන්ට සමාන පරිදි ඇඳුම් කට්ටලයක්, පොත්පත් කට්ටලයක් නොමැති අවස්ථාවලදී එම දරුවා සමාජය තුළ අසීරුතාවයට පත් වන බොහෝ අවස්ථාවන් අප විසින් දැක ඇත. එවන් දරු දැරියන්ගේ මානසිකත්වය නඟා සිටුවීමට හා ඔවුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දී පාසල් හැර යාමෙන් ඔවුන් වළක්වා ගැනීමට බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ යම් ප්‍රතිපාදන වෙන් කර විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම්.එම්.එම්. අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ පූ.භා. 11.39 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, අපි දකිනවා අද අධ්‍යාපන අමාත්‍යාංශය බස්නාහිර පළාත් සභාව තුළ සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කරන මේ මොහොතේදී මම හිතන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් අද බස්නාහිර පළාත් සභාව තුළ කොන්ද කෙළින් තියාගෙන හොඳ මානසිකත්වයක් යටතේ අපට ගමට ගිහිල්ලා වැඩ කරන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරපු අපේ අධ්‍යාපන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා මේ අවස්ථාවේදී සිහිපත් කිරීම කාලෝචිතයි කියලා කියනවා. ඒකට හේතුව. බස්නාහිර පළාතේ පාසල්වල භෞතික තත්ත්වය, ගුණාත්මක භාවය ඉහළ නැංවීමට, ඒ වාගේම අඩක් නිම කළ පාසල් ගොඩනැගිලි සම්පූර්ණ කිරීමට. ඒ වාගේම පාසල්වල තිබෙන්නා වූ ගුරු හිඟය අවම කිරීමට කටයුතු කිරීම. මම හිතන්නේ 2010, 2011, 2012 වසර තුන තුළ උපාධිධාරීන් 6000 කට අධික සංඛ්‍යාවක් ගුරුවරුන් බවට පත් කරලා බස්නාහිර පළාතේ සමස්ත ගුරුවරුන්ගේ සංඛ්‍යාව 32,000 ක් වනකොට, ඒ වසර තුන තුළ ගුරුවරු 6000 කට ආසන්න සංඛ්‍යාවක් පත් කරලා සමස්තයක් වශයෙන් 20% ක ගුරු සංඛ්‍යාවක් පත් කර ගැනීම තුළ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල නැම්මක්, ප්‍රබෝධයක් ලබා දුන් අමාත්‍යාංශයක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේ ගුරු තුලනයක් පවත්වාගෙන යන, ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සියලු පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කරලා තිබුණත් සමාජය තුළ අපි දකින එක දෙයක් තිබෙනවා.

අද බස්නාහිර පළාතේ දිළිඳු ජනගහනය 15.6% ඉඳලා 8.9% දක්වා අඩු වෙලා තිබෙනවා. මෙසේ අඩු වුණු මොහොතක දිළිඳු ජනගහනය 8.9% ජීවත්වන ජනතාව වෙනුවෙන් කථා කරන්න තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක මම මේ සභාවේදී මතක් කරන්න ඕනෑ. කුමන ආණ්ඩු ආවත්, කුමන පළාත් සභා පාලනය කළත්, අපට සියයට සියයක්ම දුගී දුප්පත්කම අඩු කරන්න බැහැ. නමුත් වර්තමාන සමාජය තුළ දිළිඳුභාවය 15.8 සිට 8.9 දක්වා අඩු කළත්, මේ දිළිඳු ජනතාව වෙනුවෙන් යම්කිසි ව්‍යාපෘතියක් අපි අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් ආරම්භ කිරීම යෝග්‍යයයි කියලා මේ අවස්ථාවේදී අපට හැඟෙනවා. මක් නිසාද කියතොත්, අපි දන්නවා දෙසැම්බර් මාසයේ නිවාඩුව අවසන් වෙලා ජනවාරි මාසය වනකොට ගෙදර ඉන්න ළමයා පාසලට යන්න සූදානම් වනකොට ඒ ගෙදර ළමුන් හතර දෙනෙක්, පස් දෙනෙක් ඉන්නවා නම්, ඒ නිවස අඩු ආදායම් ලබන පවුලක් නම්, තමන්ගේ අම්මාට තාත්තාට ඒ ළමයා කියනවා, අම්මේ තාත්තේ මට පොත් ටික අරන් දෙන්න. මට සපත්තු අරන් දෙන්න. මට ඇඳුම් ටික අරන් දෙන්න කියලා කියනකොට ඒ ළමයා වෙනුවෙන් ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්න බැරි වුණාම දෙමව්පියෝ මානසිකව දුක්වන අවස්ථා තිබෙනවා. මානසිකව කම්පා වන අවස්ථා තිබෙනවා. ඒ සමාජ කර්තව්‍යය ඒ දෙමව්පියන්ට ඉෂ්ට කරන්න බැරි වුණාම මම හිතන්නේ ඒ දරුවාට ඒ පාසල ආරම්භ කරන වසරේ පළමුවන දිනය හෝ දෙවැනි දිනය හෝ පළමුවැනි සතිය හෝ පළමුවැනි මාසය තුළ හෝ ඒ දරුවා පාසලට යෑමේ අඩු ප්‍රවණතාවයක් දක්වන අවස්ථා අපි දකිනවා. ඒ පාසල් යන ළමයාට සපත්තු ජෝඩුවක් හම්බ වුණේ නැත්නම්, ඒ පාසල් යන ළමයාට ඇඳුම් කට්ටලයක් හම්බ වුණේ නැත්නම්, ඒ ළමයාට පොත් පත් ටික හම්බ වුණේ නැත්නම් මදි පුංචිකමක් තුළ ඒ ළමයාට පාසලට යාම එපා වෙනවා. අන්න ඒ නිසා සමාජයේ අත්දැකීම් දිහා බලනකොට අපි දකිනවා අද රජයක් වශයෙන්, පළාත් සභාවක් වශයෙන්, පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය බිලියන 16 ක මුදලක් මේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරනකොට, බස්නාහිර පළාතේ ගුරුවරුන් 32,000 කට පඩි ගෙවනකොට, මේ අධ්‍යාපන

අමාත්‍යාංශයෙන් බස්නාහිර පළාත් සභාවේ ශිෂ්‍යයන් ලක්ෂ 7 කට අධ්‍යාපනය දෙනකොට, මේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ සියලු කර්තව්‍යයන් කරනකොට මම හිතන්නේ අද බස්නාහිර පළාත් සභාව තුළ අඩු ආදායම් ලබන පවුල්වල දූ දරුවන් වෙනුවෙන් යම්කිසි මෙහෙවරක් කිරීම අප තෝරා ගන්න ඕනෑ. මේ ව්‍යාපෘති තෝරා ගැනීමේදී ළමයාගේ ගරුත්වයට හානියක් නොවන විධියට, ඒ ළමයා පාසල තුළ අසීරුතාවයට පත් නොවන විධියට ඒ ළමයා වෙනුවෙන් යම්කිසි අධීක්ෂණයක් කරලා මේ දිළිඳු දරුවා වෙනුවෙන් ගුරුවරයා හෝ වේවා, විදුහල්පතිවරයා හෝ වේවා, යම්කිසි තක්සේරුවක් කරලා ඒ ළමුන් වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒ ළමුන්ට අදාළ පරිත්‍යාගය ලබා දීමට ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කරන්න ඕනෑය කියන එක තමයි මගේ යෝජනාවේ හරය. මේ ශිෂ්‍යත්ව ක්‍රමය දිළිඳු පාසල්වල, දිළිඳු දරුවන් වෙනුවෙන් ලබා දීමේදී මම හිතන්නේ උස් පහත් භේදයක් නැතුව, ඒ ළමයාට අසාධාරණයක් නොවෙන විධියට, ළමයාගේ ආත්ම ගරුත්වයට හානියක් නොවෙන විධියට තෝරා ගන්න ඕනෑ කියන එක තමයි අපි මේ අවස්ථාවේදී දකින්නේ.

අපි දකිනවා, සමස්තයක් වශයෙන් බස්නාහිර පළාත් සභාවේ ළමුන් හත් ලක්ෂයක් විතර අධ්‍යාපනය ලබනකොට ආර්ථික අමාරුකම් තිබෙන ළමුන් 50,000 ක් ඉන්න පුළුවන්. එහෙම නැත්නම් ලක්ෂයක් ඉන්න පුළුවන්. එහෙම 50,000 ක් හිටියත්, ලක්ෂයක් හිටියත් එක් ළමයෙක් වෙනුවෙන් වසරකට රුපියල් 2000 ක මුදලක් වෙන් කරන්න පුළුවන් නම් මම හිතන්නේ ඒක විශාල මුදලක් වෙන්නේ නැහැ. අපි දකිනවා, එක් ළමයෙකුට වසරකට රුපියල් 20,000 කට ආසන්න මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වෙන් කරනවා. ඒ පාසල් අධ්‍යාපනය සඳහා. හත් ලක්ෂයටම බිලියන 15 ක මුදලක් වෙන් කරනකොට එක් ළමයෙකුට රජයෙන් වියදම් කරන මුදල රුපියල් 20,000 ක්, 25,000 ක් වශයෙන් වෙන් කරන්න වෙනවා. එහෙම වෙන් කරනකොට සමස්ත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් 5% ක් 10% ක් දිළිඳු ශිෂ්‍ය ශිෂ්‍යයාවන් තෝරා ගෙන අඩුම ගාණේ වසරකට රුපියල් 2000 ක 2500 ක ඇඳුම් කට්ටලයක්, පාවහන් කට්ටලයක් හෝ පොත් කට්ටලයක් ලබා දීමේ නියාමක ව්‍යාපෘතියක් බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය අමාත්‍යාංශයෙන් ආරම්භ කිරීමට ලබන අයවැයෙන් හෝ මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න කියන එක තමයි අපි මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ. මේක ඉතාම වැදගත් කාලෝචිත ක්‍රියාවක් කියලා අපි මේ අවස්ථාවේදී දකිනවා.

අද හැකියාවන් තිබෙන, දක්ෂතාවයන් තිබෙන දුප්පත් දූ දරුවන් ඉන්නවා. නමුත් ඒ අහිංසක දූ දරුවන් නහා සිටුවන්නට, ඒ අහිංසක දූ දරුවන්ගේ දිරිය ශක්තිමත් කරන්නට, ඒ දූ දරුවන්ගේ හැකියාව තුළ තමන්ගේ අධ්‍යාපනය ලබා ගෙන රටේ නියම පුරවැසියෙක් බවට පරිවර්තනය වෙන්න අවශ්‍ය කරන මූල්‍යමය සම්පත් ලබා දීම තමයි මේ ව්‍යාපෘතිය හරහා බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අහිංසක දූ දරුවන් වෙනුවෙන්, හැකියාව තිබෙන දක්ෂතාවයන් තිබෙන මේ දූ දරුවන්ව සමාජයේ වැඩදායී, සමාජයේ ඵලදායී දූ දරුවන් බවට පරිවර්තනය කරන්නට අපි මේ වාගේ නියාමක ව්‍යාපෘතියක් ආරම්භ කිරීම මම හිතන්නේ අනෙකුත් පළාත් සභාවලට ලබා දෙන්නා වූ ආදර්ශයක් කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි. ඒ නිසා අපි දකිනවා, අපේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කරලා තියෙනවා, අහිංසක දරුවන් වෙනුවෙන් සපත්තු කට්ටලයක් ලබා දීමට. මම හිතන්නේ ජාතික අය වැයත්, ඒ වාගේම පළාත් සභා අය වැයත් බද්ධ කරලා, ජාතික අය වැයෙන් ඒ වාගේ තීන්දු තීරණ ලබා දීමේදී ඒ හා සමාන විධියට බස්නාහිර පළාත් සභාවක් වශයෙන් අඩුම ගණනේ 2014 වසරේදී මේ යෝජනාව නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කිරීමට අවශ්‍ය කරන මූලික අඩිතාලම දමන්න ඕනෑ කියන එක තමයි අපි මේ අවස්ථාවේ දකින්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි මේ ලබා දෙන්නා වූ යෝජනා අවසානයේ කුණු බක්කියට නොදමා, මේ යෝජනාවේ හරයන් පිළිබඳව හොඳට විවාද කරලා, විශ්ලේෂණය කරලා, ඒ වාගේ තියෙන ප්‍රතිලාභ පිළිබඳව සළකා බලලා, මේ යෝජනාවේ වැදගත්කම පිළිබඳව සළකා බලලා, මම හිතන්නේ අඩුම ගණනේ 2014 වසරේදී අපේ අය වැය සකස් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරනවා ඇතැයි කල්පනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[ පූ.භා. 11.50 ]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, 2013 වර්ෂයේ ප්‍රථම රැස්වීම පවත්වන මේ අවස්ථාවේ දී ඔබතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට සුභ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාවට කථා කරන්න ලැබීම පිළිබඳව මම සංතෝෂ වෙනවා. හැබැයි, එහෙම සංතෝෂ වන ගමන්ම කියන්න කැමතියි, මේ යෝජනාව මේ පළාත් සභාවට ක්‍රියාත්මක කරන්න පුළුවන් යෝජනාවක්. ඒ පිළිබඳ ඇහුම්කන් දෙන්නට අමාත්‍ය මණ්ඩලයේ එක සාමාජිකයෙක් හැර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හතර දෙනෙකුට සීමා වීම පිළිබඳව මගේ කනගාටුව මේ වෙලාවේ මම පුද කරන්න ඕනෑ. විශේෂයෙන්ම විපක්ෂයක් හැටියට අපේ වගකීම අද දවසේ ඉෂ්ට කරන අතරම, එතුමාගේ මේ යෝජනාව සැබවින්ම ක්‍රියාත්මක කරන්න හැකියාව තියෙන ඒ බලධාරීන් මේ පිළිබඳව උනන්දුවක් නොදැක්වීම මම හිතන්නේ සත්‍ය වශයෙන්ම බස්නාහිර පළාතේ ජීවත් වන පාසල් යන දරුවන් පිළිබඳව මොන විධියේ කරුණු කාරණා කිව්වත්, සැබෑ තත්ත්වය පිළිබඳව ඇහුම්කන් දීමට තියෙන අවස්ථාව නොමැතිවීම පිළිබඳව මම මේ වෙලාවේ ඉතාමත් කනගාටුවෙන් වුවත් මතක් කරන්න සතුටුයි.

විශේෂයෙන්ම අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාවෙන් කියන්නේ, අපේ පළාත් සභාව තුළ ජීවත් වන දරුවන්ගේ පාසල් යාම වැඩිදියුණු කරන්න වුවමනා කරන යටිතල පහසුකම් ලබා දීම පිළිබඳවයි. එවැනි යෝජනාවක් තමයි මේ ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම මේ රටේ පාසල් යන දරුවෝ පාසල් යැවිය යුතුයි කියන සංකල්පය 1977 න් පස්සේ ඇති වුණු එක්සත් ජාතික පක්ෂ රජයේ ශ්‍රීමත් ජේ.ආර්. ජනාධිපතිතුමාගේ කාලයේ ඉතා හොඳින් ක්‍රියාවට නංවන්නට කටයුතු කළා. එහි ආරම්භයක් හැටියට තමයි, පාසල් පොත් නොමිළයේ ලබා දීමේ වැඩ සටහන ආරම්භ කළේ. ඊළඟට තවත් ටිකක් මෙය වැඩි දුරට සංවර්ධනය වන විට විශේෂයෙන්ම 88, 89 කාලයේ දරුණු භීෂණ යුගයකින් පස්සේ මේ තරුණ අසහනය පිළිබඳ කොමිෂන් වාර්තාවේ ඉදිරිපත් කළ යම් යම් යෝජනාවලදී මේ දරිද්‍රතාවය පිළිබඳව මතු වුණු කාරණා උපයෝගී කර ගෙන, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා පාසල් දරුවන්ට දිවා ආහාරය දෙන්න, නිල ඇඳුම දෙන්න, පාසල් පොත් ටික දෙන්න ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ගෙන ආ ඒ වැඩ පිළිවෙළ තවත් දුරට ඉදිරියට ගෙන යන්න කටයුතු කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංඛ්‍යාලේඛන දිහා හැරිලා බැලුවොත් ඒ වකවානුවේ පාසල් නොගිය දරුවන් බහුල වශයෙන් පාසල්වලට යන්න පටන් ගත්තා. ඒ නිසා දකුණු ආසියාවේ සාක්ෂරතාව දියුණුම රට හැටියට ශ්‍රී ලංකාවට පත් වෙන්න පුළුවන්කම ලැබුණා. නමුත් අද මේ යෝජනාවෙන් ඉදිරිපත් කරන්නේ, එතුමා නොකියා මේ කියන්නේ අද වනකොට මේ තත්ත්වය ඉතා බැරෑරුම් තත්ත්වයට මේ රටේ අපේ පළාත තුළ, ඒ වපසරිය තුළ ක්‍රියාත්මක වෙනවා. අපි කොපමණ දුරට ලෝකයාට පේන්න කාල ඇඳලා හිටියත්, එහෙම ඉන්නවා කියලා පෙන්නුම් කළත්, සැබෑ තත්ත්වය දන්නේ මේ රටේ ජීවත් වන ජනතාව. පවුල් කිහිපයකට, එහෙම නැත්නම් මේ බස්නාහිර පළාතේ ජීවත් වන ජනගහනයෙන් 10% කට අඩු ප්‍රමාණයකට යම්කිසි සුඛෝපභෝගී ජීවිත ගත කරන්න පුළුවන්කම ලැබුණත්, විශේෂයෙන්ම මේ රටේ ජීවත් වන රජයේ සේවකයන් සහ අනෙකුත් සංස්ථාවල, සමාගම්වල ජීවත් වන, සේවය කරන සේවකයන්ගේ පවුල්වල තියෙන තත්ත්වය ඉතාමත් කනගාටුදායකයි. ඔවුන්ට සිද්ධ වෙලා තියෙනවා, මේ රටේ තියෙන සමාජ තත්ත්වයට අනුව, තමන්ගේ තත්ත්වය අනුව හැඩ ගැහිලා ජීවත් වන්න. නමුත් ඒ දුක එළියට ගිහිල්ලා කියන්න බැහැ. අද රටේ පහළම ආදායම් ලබන ජනතාව කියලා අපි තෝරා ගෙන ඉන්නවා. ඒ මිණුම් දඬු කොයි විධියට සකස් වෙලා තියෙනවාද කියන එක පිළිබඳව අපට

[ ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා ]

ප්‍රශ්නයක් තියෙනවා. එහි නිවැරදිතාවය පිළිබඳව ගැටලුවක් තියෙනවා. ඒ අයට තමයි සමෘද්ධිලාභීන් හැටියට අද යම් කිසි දීමනාවක් දෙන්නේ. හැබැයි, ඊට වඩා අන්ත අසරණ විධියට ජීවත් වන මේ රටේ මධ්‍යම පාන්තික ජනතාව, විශේෂයෙන්ම රජයේ සහ අනෙකුත් ආයතනවල සේවය කරන ජනතාව ඒ ආදායම්වලින් ජීවත්වන පවුල් විශාල ප්‍රමාණයක් අද ඉන්නවා. ඒ අය මේ මිණුම් දණ්ඩට වැටෙන්නේ නැහැ. ඒ නිසා හැම වේලාවකම බැට කන්නේ අර මධ්‍යම පන්තියේ ඉන්න, එහෙමත් නැත්නම් අඩු ආදායම්ලාභී ජනතාව කියලා අපි තීරණය කරලා - සමෘද්ධි ප්‍රතිලාභ ලබා දෙන ජනතාව නොවෙයි. ඊට වඩා ඉහළ තලයක ජීවත් වනවාය කියලා අපි විශ්වාස කර ගෙන, ඒ පිළිබඳව අපි කටයුතු කර ගෙන යන ජනතාවගේ දරුවන්ට තමයි ඇත්ත වශයෙන්ම අද පාසල් යාමේ ගැටලුව මතු වෙලා තියෙන්නේ. ඒ අයගේ දරුවන්ට වුවමනා කරන පොත්පත් ටික ගන්න, ඇඳුම් පැළඳුම් ටික සකස් කර ගන්න, ආහාර වේල නිසි විධියට සකස් කර ගන්න අද විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා. අපි දකිනවා. විවිධ අවස්ථාවලදී ජනමාධ්‍ය මඟින් අපි දකිනවා. මේ සභාවේම මන්ත්‍රීවරු පොත් පත් බෙදනවා, නිල ඇඳුම් බෙදනවා, විවිධ උපකරණ දෙනවා, මේ දරුවන්ගෙන් ජීවන තත්ත්වය නගා සිටුවලා මේ පාසල් අධ්‍යාපනයට දරුවන් යොමු කරන්න.

මේ යෝජනාවේ තියෙනවා. පාසල් ගොඩනැගිලි හැදිලා තියෙනවා. ඒ පාසල්වලට වුවමනා කරන ගුරුවරු සංඛ්‍යාව ඉන්නවා. මම හිතනවා, පරණ තිබුණු තත්ත්වයට වඩා 2012, 2013 ලබන කාලය වෙන කොට ඒ තත්ත්වය පිළිබඳ යම් වර්ධනයක් තියෙනවාය කියන එක අපි පිළිගන්න ඕනෑ. අපට පේන්න තියෙන දේ. නමුත් ඒ පාසල් ගොඩනැගිලි හැදුවාට, දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න ගුරුවරු ඒ පාසල්වල හිටියාට, විද්‍යාලවල හිටියා අනෙකුත් සම්පත් තිබුණාට, මූලිකම සම්පත වන මිනිස් සම්පත, එහෙම නැත්නම් අපේ දරුවෝ විද්‍යාලයට ඇතුළට නොගියොත් එහෙම අපි මේ ගන්න ව්‍යායාමයෙන් කිසිම ප්‍රයෝජනයක් වන්නේ නැහැ. එහෙම නම් විශේෂයෙන්ම අපට කරන්න තියෙන්නේ එතුමාගේ මේ යෝජනාව අනුව - එතුමාගේ යේජනාවේදී කිව්වා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පුළුවන්ය කියල මේ සඳහා මුදලක් වෙන් කරන්න.

මේ පළාත් සභාවේ 2013 වර්ෂයේ සමස්ත අය වැය ගත්තාම 75% කට වැඩිය වෙන් කළේ ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය සඳහා. එතකොට ඒ අමාත්‍යාංශය සඳහා මුදල් වෙන් කරන කොට ඒ විවාදයට සහභාගි වුණු මන්ත්‍රීවරයෙක් හැටියට මම කිව්වා, මෙය ප්‍රමාණවත් නැහැ. වෙන් කරන මුදලවත් ප්‍රමාණවත් නැහැ. අනෙක් අමාත්‍යාංශවලට ගියේ 2% යි, 3% යි, 5% යි, 10% යි ඒ වාගේ. නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ තියෙන ප්‍රධාන අමාත්‍යාංශයට වෙන් වුණු මුදලවත් ඒ තරම් ප්‍රමාණවත් වුණේ නැහැ. එහෙම ප්‍රමාණවත් නොවී තියෙන කොට, මූලික වැඩ කටයුතු ටික කරන්නට අපි කොහොමද මෙතුමා කරන මෙම යෝජනාවට තව මුදලක් වියදම් කරන්නේ? ඒ සඳහා වුවමනා කරන ප්‍රතිපාදන කොහෙන්ද ලබා ගන්නේ? එහෙම නම් අද මේ රටේ පැහැදිලිවම දරිද්‍රතාවය තියෙනවා. නැති බැරි කම තියෙනවා. අසහනය තියෙනවා. ඒ නිසා තමයි මේ යෝජනාව අද බස්නාහිර පළාත් සභාවේ ඇතුළේ අපි සාකච්ඡා කරන්නේ. එහෙම නම් මෙයට තනිව මුහුණ දෙන්න බස්නාහිර පළාත් සභාව හැටියට මම හිතන්නේ අපට පුළුවන්කමක් නැහැ. අපට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ යන රජයත් එක්ක ගණු දෙණු කරන

ආකාරයත් එක්ක. රටේ ආදායමත් එක්ක. රටේ ආදායම වැඩිදියුණු කරන්නේ කොහොමද කියන එකත් එක්ක. කොහොමද මේ ණය බර අඩු කර ගන්නේ කියන එකත් එක්ක. විදේශ ණය ප්‍රමාණය එන්න එන්නම අධික පොළියට අරගෙන එදිනෙදා එදා වේල ටුවර්ස් ගෙන යන මේ ආණ්ඩුවට පුළුවන්කමක් තියෙනවයි කියලා මම හිතන්නේ නැහැ, බස්නාහිර පළාත් සභාව තුළ තියෙන මේ සැබෑ ප්‍රශ්නයට උත්තරයක් සපයන්න. එහෙම නම් බස්නාහිර පළාත් සභාවක් හැටියට අපි ඉතාමත් අසරණයි. මොකද, මධ්‍යම රජයෙන් ආධාර ලැබෙන්නේ නැත්නම්, මධ්‍යම රජය හරියට ක්‍රියාත්මක වන්නේ නැත්නම්, මම එදා කියපු වචනය තමයි අදත් කියන්න ඕනෑ. එදා වේල ටුවර්ස්. අද මම දැක්කා. මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා කියනවා, තවත් මිලියන ගණනක් අපට දෙන්න ලැහැස්තියි කියලා. අපට මිලියන ගණන් දෙන්න ඕනෑ කෙනෙක් ලැහැස්තියි තමයි. හැබැයි ඒවාට ණයයි, පොළියයි ගෙවන්න වුණාම මේ ඉන්න දරු පරම්පරාව විතරක් නොවෙයි. මේ අද පාසල් යන දරු පරම්පරාව විතරක් නොවෙයි. ඒ දරුවන්ගේ දරුවන්ටත් ඒ ණය ගෙවන්න සිද්ධ වෙනවයි කියන කාරණාව මතක් කරමින්, එතුමාට ප්‍රඥාව පහළ වෙලා මෙවැනි යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කරලා, නමුත් එය ක්‍රියාත්මක කරන්න බැරි වීමේ සිහිනය, ක්‍රියාත්මක කරන්න බැරි වීමේ කනගාටුව අපේ හිතේ තියාගෙන මම කථාව නිමා කරනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.59 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මේ යෝජනාවට කරුණු දැක්වීමට අවස්ථාව සලසා දීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ යෝජනාව ගෙනාපු අම්ජාඩ් මන්ත්‍රීතුමාත් අහිංසක දරුවෝ වෙනුවෙන් යමක් කරන්න උත්සාහ කරමින් මේ යෝජනාව ඉදිරිපත් කරපු බව මම හොඳින්ම දන්නවා.

දැන් අපේ සිරිකමල් මන්ත්‍රීතුමා මේ රජයෙන්, බස්නාහිර පළාතෙන් මේ වකවානුව තුළ කෙරෙන අධ්‍යාපන කටයුතුවල සාර්ථක භාවය ගැනත් කථා කළා. මොකද, ඒ ගැන කථා නොකොට බැහැ. ඒක හොඳට පෙනෙන්නට තියෙන දෙයක්. මහ ආණ්ඩුවත්, පළාත් සභාවත්, දෙකම අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වෙන් කරනවා. ඒ වාගේම ජනාධිපතිතුමාත් පෞද්ගලිකවම ඒ පිළිබඳව හොයලා බලන බව අපට රූපවාහිනිය බැලුවත්, පත්තර බැලුවත් පෙනෙන්න තියෙනවා. මම හිතන්නේ නැහැ කිසිම කෙනෙක්, ඒ තත්ත්වයෙන් දරුවන් ගැන හොයා බැලුවා කියලා. දරුවන්ට දිය හැකි සම්පත් උපරිම හැටියට ලබා දෙනවා. නමුත් මම ඒවා ප්‍රමාණවත්ම කියලා කියන්නේ නැහැ. අපි ඉස්කෝලේ යන කාලේ රජයකින් අපට එහෙම සම්පත් ලැබුණේ නැහැ. අපි ඉස්කෝලෙ යන කාලේ මට මතකයි. අපේ තාත්තා, අපි අට දෙනෙක්. සමහර වෙලාවට පරණ පොත් කඩයට ගිහිල්ලා තමයි පාඩම් කරන්න Secondhand පොත් අපට ගෙනැත් දෙන්නේ. හැබැයි අඩුවක් කළේ නැහැ. ඒ අයගේ ශක්ති ප්‍රමාණයෙන් අපට ලොකු සම්පත් ටිකක් ලබලා දුන්නා. අද සමහර පවුල්වල ඉන්නේ එක්කෙනයි. දෙන්නයි. අර වැඩියෙන් ඉන්න පවුල්වලට ඒ ප්‍රශ්නය බලපෑවත්, එදාට වඩා සම්පත් ගොඩක් ඒ දරුවන්ට ලැබෙනවා. හැම අවුරුද්දේම නිල ඇඳුමක්. කියවීම් පොත් ටික අනිවාර්යයෙන්ම ලැබෙනවා.

ඒ වාගේම පාසල් එදාට වඩා යම් දියුණුවක් ලබලා තියෙන බව බාහිරව ඉඳන් බැලුවත් පේනවා. ගරාවැටුණු, අවුරුදු ගණනකින් repair කරලා නැති, බිත්ති කළුපාට ගැසුණු, පාසල් අද නැහැ. මොකද, අපේ ගරු මහ ඇමතිතුමාගේ සුපසන් නිම් තෙර වැඩ සටහන, හැම වර්ෂයේම තීන්ත ගාලා ඒ පාසල ප්‍රියජනක ස්ථානයක් කරන්න විශාල වැයමක් කරනවා. ඒ වැයම තුළින් අද හොඳ ප්‍රතිඵලයක් ලැබිලා තියෙනවා. දරුවාට පාසලට යන්න, ගුරුවරයාට පාසලට යන්න, ඉගෙන ගන්න වුවමනාවක් හිත් තුළ ඇති කරන ප්‍රසන්න වාතාවරණයක් ලබලා දීලා තියෙනවා. ඒ වාගේම හැම පාසලකටම වැසිකිළි පද්ධතිය බැගින් ලංකාවේම පාසල්වලට ලබා දීලා තියෙනවා.

ඒ වාගේම අපි නොසිතන විධියට ගුරු හිඟය බොහෝ දුරට අඩු කරලා තියෙනවා. මට මතකයි, මම පළාත් සභාවට පත් වෙලා එන වකවානුවේදී කොලොන්නාව ආසනයේ එකසිය අනූගණනක් විතර තිබුණා. රොජිනෝල්ඩ් කුරේ ඇමතිතුමා අපට ඒ සම්බන්ධව බොහෝ උදව් කළා. නමුත් ඒ ගුරු හිඟය සම්පූර්ණයෙන් පියවා ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා පාසලට එන දරුවන්ට හරියට අධ්‍යාපනයක් දෙන්න ගුරුවරු නැතිකම කැපී පෙනෙන තත්ත්වයෙන් බස්නාහිර පළාත තුළ තිබුණා. නමුත් අද ගුරුවරුන් පාසල්වලට ලබා දුන්නා විතරක් නොවෙයි. දැන් නැවත වරක් ගුරුවරුන් බඳවා ගෙන විශ්‍රාම ගියාම ගුරුවරයෙක් පත් කරන්න පුළුවන් මට්ටමකට එතුමා මේ තත්ත්වය සකස් කරලා තියෙනවා. ඒ වාගේම එතුමා කොට්ඨාශයෙන් කොට්ඨාශයට යනවා. ගිහිල්ලා විදුහල්පතිවරු, ඒ අවශ්‍ය නිලධාරීන් සහ ඒ අංශ භාර ප්‍රධානීන් ගෙන්වා ශිෂ්‍යත්ව ප්‍රතිඵල නගා සිටුවන්න, සාමාන්‍ය පෙළ, උසස් පෙළ ප්‍රතිඵළ නගා සිටුවන්න විශාල වැයමක් කරමින් උපදෙස් දෙනවා. ඒ අවශ්‍යතා මොනවාද කියලා බලලා එතුමාගේ ශක්ති ප්‍රමාණයෙන් පාසල්වලට ඒවා ලබලා දෙනවා. අද බස්නාහිර පළාත තුළ ගුරුවරුන්ට පන්ති කාමරයට ඇවිල්ලා නිකම් ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේ අධ්‍යයනයක් හැම තිස්සේම පිටුපස්සෙන් ඉඳන් කරනවා. ඒ වාගේම ව්‍යුහගත කමිටු තුළින් මන්ත්‍රීවරුන්ට අවස්ථාව තියෙනවා, ඒ නිලධාරීන් එක්ක එකතු වෙලා විදුහල්පතිවරු දිහා බලලා, අඩුපාඩු හොයලා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ලැබෙන මුදල්වලින් ඒ අඩුපාඩු බොහෝ දුරට සම්පූර්ණ කර ගන්න අපට අවස්ථාව දීලා තියෙනවා. මෙය විශාල ප්‍රගතියක් හැටියට තමයි මම දකින්නේ.

ඒ වාගේම පරිගණක වාගේ දේවල් ඉගෙන ගන්න පුළුවන් වාතාවරණය හැම පාසලකම තියෙනවා. පාසලක බොහොම

කලාතුරකින් තමයි ඒ වාගේ තත්ත්වයන් නැත්තේ. ඒවාත් අනාගතයේ ලැබෙයි කියන විශ්වාසය අප තුළ තියෙනවා. එය මම හිතන්නේ, මේ රටේ ජනතාවගේ සිත් තුළ තියෙනවා. යම් යම් කඩාකප්පල්කාරී බංකොලොත් පිරිස් අධ්‍යාපනය පිළිබඳ මොන විධියේ අවුල් සහගත තත්ත්වයන් ඇති කරන්න හැදුවත් මම හිතන්නේ, ඒවා බොහොම ක්‍රමානුකූලව නිරවුල් කරගන්න අතිගරු ජනාධිපතිතුමා, අපේ ප්‍රධාන අමාත්‍යතුමා හැම තිස්සේම පියවර ගන්නවා. අම්ජාඩ් මන්ත්‍රීතුමා පැහැදිලි කළේ, අපි එපමණ කළත් තවමත් සමහර පවුල්වල පාසල් යන්න අපහසුතා තියෙන දරුවෝ ඉන්නවා කියලයි. ඒකත් අපි පිළිගන්න ඕනෑ. සමහර වෙලාවට එහෙම ඇති වෙන්න හේතුව, දෙමාපියන්ගේ නොදැනුවත්කම. සමහර දුප්පත් දෙමව්පියන් මේ වගකීම නිවැරදිව හඳුනා නොගැනීම. ඒ වාගේම දේශපාලඥයෝ වශයෙන් අපේ ප්‍රදේශ තුළ ඒ වාගේ අවස්ථාවන් බලලා, ඒ දෙමව්පියන්ට කරුණු පැහැදිලි කරලා පාසලට එවා ගන්න කටයුතු කරන්න ඕනෑ. මගේ ප්‍රදේශයේ පාසල් යන්නේ නැති මුස්ලිම් දරුවෝ විශාල ප්‍රමාණයක් හිටියා. සිංහල දරුවන් විශාල ප්‍රමාණයක් හිටියා. මම ඒ ප්‍රදේශවල ඉන්න මගේ නියෝජිතයින්ට කියලා ඒවා හොයා බලලා, අපි ඒ අයට පාසල් ලබා දෙන්න සැලසුම් කළා. ඒ කටයුතු මන්ත්‍රීවරු වශයෙන් අපි කරන්නට ඕනෑ. සමහර විට සිරිකමල් මන්ත්‍රීතුමා කියපු දේට මම එකඟ වෙනවා. මේ සියල්ල අපට දෙන්න පළාත් සභාවේ ආර්ථික ප්‍රශ්න තියෙන්න පුළුවන්. රජයේ. රජය මේ කරන විශාල වියදම් එක්ක ඒ වාගේ අපහසුකම් තියෙන්න පුළුවන්. නමුත් අපි උත්සාහ කරන්න ඕනෑ, ඒ වාගේ දරුවන් හඳුනාගෙන පළාත් සභාවෙන් කරන්න පුළුවන් ප්‍රමාණය කරන ගමන්, ප්‍රදේශයේ දානපතියෝ, සම්පත් දායකයෝ හොයලා ඒ වාගේ දරුවන්ට පාසල් යන්න අඩුපාඩු සම්පූර්ණ කර දෙන්න. පාසල් දරුවන්ට ඒ වාගේ දේවල් ලබා දෙන්න ඒ දානපතියෝ එහෙම නැත්නම් ඒ උපකාර කරන අය කවදාවත් බැහැයි කියන්නේ නැහැ. ක්‍රමාණුකූලව එය ඉදිරිපත් කළොත් ඒ තත්ත්වය ශක්තිමත් කර ගන්න පුළුවන්.

ඒ වාගේම මගේ මිත්‍ර සිරිකමල් මන්ත්‍රීතුමා කිව්වා ණය වෙලයි කියලා. මම අහනවා. කොයි ආණ්ඩුවද ණය වුණේ නැත්තේ? මහවැලිය හදන්න එතුමාලා ණය වුණේ නැද්ද? ඒවා අනාගත පරම්පරාව ගෙව්වේ නැද්ද? ඒවා ගෙදරින් ගෙනැල්ලා හැදුවා නොවෙයි නේ? ඒවායේදීත් ණය ගත්තා. හැබැයි, එලවත් යෝජනාවලට ණය ගත්තාම, ඒවා ගෙවා ගන්නත් අපට සිද්ධ වෙනවා. එය අපේ වගකීම, රට වෙනුවෙන්. අපේ දරුවන්ගේ

[ ගරු අශෝකා ලංකාතිලක ]

ප්‍රශ්න ගැන කථා කරලා, ඒවා යටපත් කරන්න බැහැ. අද හොඳ මාර්ග පද්ධතියක් තියෙනවා. අද විශාල සංවර්ධනයක් රටේ තියෙනවා.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

වැස්සට ඒවා ඔක්කෝම යට වුණා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඉතින් ඒක ස්වභාව ධර්මයේ හේතුවක් මිසක්, වෙන දෙයක් නොවෙයි. ඒවාටත් අපි මුහුණ දෙන්න ඕනෑ. යට වුණාම හදන්න ඕනෑ.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

බොරු වැඩත් කරලා තිබුණා. ඒකයි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

තමුන්නාන්සේලාගේ කාලයේ හරියට වැඩ කළා කියන එක අපි හොඳට දන්නවා. අපි ඒ කාලේ මැරිලා, දැන් ඉපදුනා නොවෙයි. අපිත් ඉපදුණු කාලේ.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

මහවැලිය -

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මහවැලියේ වුණු දේවලුත් අපි දන්නවා. සමහර මිනිස්සු පොහොසත් වුණු හැටි. එංගලන්තයෙන් ඇපල් වතු ගත්ත හැටි. අපි මියගිය මිනිස්සුන්ට අපහාස කරන්න කැමති නැහැ. එදා ඒ ගැනත් මීට වඩා ලොකුවට සංවාදයට ලක් වුණා. අද මේ අරවා, මේවා කියන අය පොකුරු පිටින් දරුවෝ මරලා දාන කොට, සමූහ මිනීවලවල් ඇති වෙන කොට, ටවුන්වල කොල්ලෝ මරලා දාන කොට, බෙලි කපලා බෙලි ගහලා තියෙන කොට ඒක භීෂණය නොවෙයිද? (බාධා කිරීමක්) අඩු ගානේ ඒවාට නඩු විභාග කළාද? පරීක්ෂණ කළාද? හැබැයි අද ඒ වාගේ දෙයක් වුණොත් පරීක්ෂණ කරලා වැරදිකරුවාට දඬුවම් දෙනවා. අර ටියුෂන් මාස්ටර් කෙනෙක් විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිට වුණු වෙලාවේ අපි අත් දෙක බැඳගෙන හිටියේ නැහැ. අපි ඒවා හෙව්වා. ඇල්ලුවා. ඒවාට දඬුවම් කරන්න කටයුතු කර ගෙන යනවා. එක එක විධියේ මිනිස්සු මේ රටේ ඉන්නවා. ඒ වාගේ මිනිස්සු ඒ විධියට -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කැලණිය සිද්ධිය -

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

කැලණිය සිද්ධියෙත් දැන් අල්ලලා තියෙනවා. (බාධා කිරීමක්) ඒ කාලේ බුරුතු ගණන් මැරිලා තවමත් සමූහ මිනී වලවල්

මතු වෙනවා එක එක තැන්වලින්. නමුත් තමුන්නාන්සේලාගේ රජය අඩු ගණනේ එක මිනී මැරුමකටවත් පරීක්ෂණ තිබ්බෙත් නැහැ. දඬුවම් කළෙත් නැහැ. ජනතා විමුක්ති පෙරමුණ ඒ පැත්තෙන් මැරුවා. ඒ අයගේ නම යන්න තමුන්නාන්සේලාත් මැරුවා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ අයත් මැරුණේ.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

සාමවිනිසුරුකම් දුන්නා ඒ ගොල්ලන්ගේ කාලේ.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

සමහර අයගේ නම යෝජනා වුණේ නැහැයි කියලා. එහෙම අනන්ත අප්‍රමාණ වුණා. අර අපේ හිටපු මහ ඇමතිතුමා නිතරම කියනවා, අසූචි කප්පරක් කාපු එකාට අර පුංචි ගඳත් ගඳක්ද කියලා. දැන් තමුන්නාන්සේලා අන්න ඒව ගැනත් හිතන්න. ඒ නිසා එක එක පුද්ගලයන්ගේ අඩුපාඩු තියෙන්න පුළුවන්. නමුත් මේ රජය කරන සංවර්ධනය ගැන කිසි කෙනෙකුට වැරැද්දක් කියන්න බැහැ. ඒ නිසා තමයි අපි හැමදාම දිනන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ ගොල්ලන්ට ඊර්ෂ්‍යාවයි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඔයගොල්ලන් ඊර්ෂ්‍යාවෙන් නොවෙයි. මනුස්ස ඇහෙන් බලන්න. පක්ෂය මොකක් වුණත් කමක් නැහැ. හොඳ වැඩවලට හොඳයි කියන්න. වැරදි වැඩ පෙන්වා දෙන තත්ත්වයට මේ රටේ මානසිකත්වය හැදුනේ නැත්නම්, අපි මීට වඩා ප්‍රපාතයකට වැටෙනවා. අන්න ඒ විධියට ශක්තිමත්ව උපකාර කරන්න. අර අපේ අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපි පක්ෂයි. බස්නාහිර පළාතේ තියෙන ආර්ථිකය හැටියට කරන්න පුළුවන් ප්‍රමාණයට කරලා, ඒ බැරි ටික මන්ත්‍රීවරු වශයෙන් වගකීම් භාර අරගෙන ඒ කටයුතු කරන්න අපට ශක්තිය ලැබෙන්න කියන එක ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු අසෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

[ අ.භා. 12.12 ]

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අම්ජාඩ් මන්ත්‍රීතුමා විසින් ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත් කාලීන යෝජනාවක් බව අප කවුරුත් පිළිගන්නවා. එහි සුවිශේෂී කරුණ වන්නේ, අර අපේ සිරිකමල් මන්ත්‍රීතුමා මේ රට, හිඟන රටක් බවට පත් වෙලා තියෙනවයි කියන එක කියන්න තමයි මේ වැදගත් යෝජනාව තුළින් උත්සාහ ගත්තේ. හැබැයි, සිරිකමල් මන්ත්‍රීතුමාට අමතක වෙලා තියෙනවා, මේ රටේ එක්සත් ජාතික පක්ෂ පාලනය ආරම්භ කරපු කාලයේ තිබුණු ඒ දුගීකම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගය වන විට ඉතා සීඝ්‍රයෙන් අඩු කරන්නට හැකියාව ලැබිලා තියෙනවා කියලා. මම හිතන්නේ අද පාර්ලිමේන්තුවේදී දිවිනැගුම පනත සම්මත වීමෙන් පසුව කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ දිළිඳු බව කියන එක තුරන් කරන්නට හැකියාව තියෙනවයි කියන එක අප තුළ විශ්වාසයක් තියෙනවා.

මේ යෝජනාවෙන් කියන්නේ, මේ දිළිඳුකමවත්, පෝසත්කමවත් ගැන නොවෙයි. මෙතුමා අදහස් කරන්නේ, මේ පාසල් පද්ධතියේ ඉන්න යම් අපහසුතාවක් තියෙන දරුවෝ සහ ඒ අවශ්‍ය කරන දරුවන්ගේ පහසුකම් සලසන්නට යම් ක්‍රමවේදයක් පළාත් සභාව සැලසිය යුතුයි කියලා. හැබැයි, ඒකේ වැදගත්ම කරුණ වන්නේ, ලංකා ඉතිහාසයේ කවදාක්වත් සෘජුවම අය වැයකින් සපත්තු දෙකක් ලබා දෙන්නට ප්‍රතිපාදන වෙන් කරපු ඉතිහාසයක් තිබුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා බලන්නට, අරලියගහ මන්දිරයේ සිරි නරඹන්නට ආපු ඉතා ඈත එපිට දුෂ්කර පාසල් දරුවන් දෙදෙනෙකුගේ ඒ සපත්තු කුට්ටම් දෙක දැකලා එතුමා තීරණය කළා, සමස්ත පාසල් පද්ධතියේ ඉන්න දරුවන් වෙනුවෙන් අයවැයෙන් ඒ අවශ්‍ය කරන සපත්තු කුට්ටම් ලබා දෙන්න. ඒක ලංකා ඉතිහාසයේ කවදාක්වත් අයවැයකින් සෘජුව වෙන් කළේ නැහැ.

අනෙක් වැදගත් කරුණ තමයි සැමදාම අපි දරුවෙකුට ලබා දුන්නේ, එක පාසල් නිල ඇඳුමයි. හැබැයි ඒ එක්කම අතිගරු ජනාධිපතිතුමා යෝජනා කළා, වසර මැද තවත් නිල ඇඳුමක් ලබා දෙන්නට අය වැයෙන් ප්‍රතිපාදන ලබා දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාසල් පද්ධතියත් සමග බද්ධ වෙලා ඉන්න අපි විශේෂයෙන්ම කොළඹ නගරයේ අපි දැකලා තියෙනවා, ඉතාමත් දුප්පත් අසරණ දෙමව්පියන්ගේ දරුවෝ තමන් පළඳින ඒ සපත්තු දෙකේ මේස් දෙක කෙළවරට වෙන කල් පෙනෙනවා. ඒකට හේතුව ආණ්ඩුවවත්, ජනාධිපතිතුමාවත්, පළාත් සභාවවත්, අපිවත් නොවෙයි. එහෙම නම්, අපට කියන්න පුළුවන් කොළඹ නගර සභාව යූ.එන්. පී. එකේ හින්දා ඒකට වග කියන්න ඕනෑ යූ.එන්.පී එක කියලා. හැබැයි, ඒහෙම කථාවක්

නොවෙයි. එහෙම දරුවෝ ඕනෑතරම් ඉන්නවා. සමහර විට අම්ජාඩ් මන්ත්‍රීතුමා අදහස් කරනවා, මේ දරුවාට අවශ්‍ය කරන පෝෂණය. නිසි පෝෂණය පාසල තුළ ලැබෙන්නේ නැහැ. උදාහරණයක් විධියට ගත්තොත් මගේ ආසනය තුළ සමහර පාසල්වල එහෙම අඩු ආදායම්ලාභී දෙමව්පියන්ගේ දරුවන් සඳහා විදුහල්පතිතුමා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය මැදිහත් වෙලා යම්කිසි වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා. සමහර දරුවන්ට ඒ අවශ්‍ය කරන බෑග් එක ගන්නට හැකියාවක් නැත්නම්, පොත් List එක ගන්නට හැකියාවක් නැත්නම් විදුහල්පතිතුමයි ආචාර්ය මණ්ඩලයයි එකතු වෙලා දානපතියෝ හරහා කරන එහෙම වැඩ පිළිවෙළකුත් තියෙනවා.

හැබැයි, අම්ජාඩ් මන්ත්‍රීතුමා කියන්නේ, මෙය විදුහල්පතිතුමාවත්, ආචාර්ය මණ්ඩලයවත් කරන කල් බලාගෙන ඉන්නේ නැතුව, අපි පාසල් තුළට ගිහිල්ලා සමීක්ෂණයක් කරලා, ආර්ථික වශයෙන් යම් අපහසුතාවයක් තියෙන දරුවෝ සෘජුව හඳුනා ගෙන - දැන් මේ ගොඩේ ඉන්න පුළුවන් සමෘද්ධිලාභීන්. එහෙම සමෘද්ධිලාභීන් නොවන අය ඉන්න පුළුවන්. එහෙම අපහසුතාවයක් තියෙන අය හඳුනාගෙන, ඒ අයට යම්කිසි වැඩ පිළිවෙළක් සකසමුයි කියන එකයි. නැතිනම් දරුවන් මේ සමස්ත ශ්‍රී ලංකාවේම විශාල ප්‍රමාණයක් පාසල හැර යන තත්ත්වයට පත් වෙනවා. මොකද, දැන් එක නිල ඇඳුමක් එක හා සමානව පළඳින්නේ, දරුවන් අතර තියෙන වෙනස නැති කරන්නට. ජාතික පාසල්. පළාත් සභා පාසල්. කොහේ බැලුවත් සුදු Shirt එකයි එක්කෝ නිල් කලිසමයි, සුදු කලිසමයි. මේ තුළින් අදහස් වන්නේ, සියළුම පාසල් දරුවෝ එක හා සමානයි කියලා. හැබැයි සමහර පාසල්වල දරුවෝ ජාතික පාසලක උත්සවයකට ආරාධනා කළාම යන්න පැකිලෙනවා. මොකද, ඒ අය පළඳින සපත්තු දෙක, නැත්නම් ඒ අය ඇඳගෙන ඉන්න Shirt එක ඉතාමත් පරණ එකක් නිසා. ඒ ප්‍රශ්නය විසඳන්න තමයි ගරු ජනාධිපතිතුමා - ලංකා ඉතිහාසයේ කවදාක්වත් නිල ඇඳුම් දෙකක් සඳහා අය වැයකින් මුදල් වෙන් කළේ නැහැ. මේ වෙන් කළේ, රට හදන්න තියෙන සල්ලිවලින්. දැන් සිරිකමල් මන්ත්‍රීතුමා කිව්වා ණයයි කියලා. හැබැයි, මේ ගත්ත ණය ජනාධිපතිතුමාගේ ගෙදරට ගෙනියන්නවත්, ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ ගෙවල්වලට ගෙනියන්නවත් නොවෙයි. මේ රටේ සමස්ත මාර්ග පද්ධතිය හදන්නට. අපටම කියලා තිබුණේ එකම එක ගුවන් තොටුපොළයි. තව ගුවන් තොටුපොළක් හැදෙනවා. හැබැයි මේවා හැදෙන්නේ, රටේ ජනතාවගේ යහපත සඳහා. අතිගරු ජනාධිපතිතුමා මේවා හදන්නට වැය කරන්නට තිබෙන මුදල් තමයි අර පාසල් දරුවෝ සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන් කළේ.

[ ගරු දයාකාන්ත පෙරේරා ]

මේ අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තියෙන වැදගත්කම ඒකයි. මේ පාසල් දරුවන් ගන්න කොට, මේ පාසල් දරුවන්ගේ ගොඩේ අපි කටයුතු කරන කොට මේ දරුවා යූ.එන්.පී ද, ශ්‍රී ලංකා ද, ජේ.වී.පී ද කියලා බලන්නේ නැහැ. අපි කටයුතු කරන්නේ



සමස්ත පාසල් පද්ධතියේම ඉන්න දරුවෝ, පාසල් දරුවෝ විධියට. ඒ පාසල් දරුවන්ගේ කටයුත්තේදී දේශපාලන කටයුත්තක් විධියට දකිනවා නම්, මම හිතන්නේ, ඒ තරම් බංකොලොත් දේශපාලනයක් එක්සත් ජාතික පක්ෂයේ නැහැයි කියලයි. මම හිතන්නේ, මේ අඩුපාඩු පෙන්නා ගෙන, මෙය හදන්නට පුළුවන් නම් මේ පාසල් පද්ධතියට අම්ජාඩ් මන්ත්‍රීතුමා අදහස් කරන ආකාරයට ඒ ඒ දරුවන් වෙනුවෙන් පෝෂණ වැඩ සටහනක් වන්නට පුළුවන්. සමහර විට සෞඛ්‍ය වැඩ සටහනක් වන්නට පුළුවන්. එක පන්තියක ඉන්න පුළුවන් සෞඛ්‍ය පහසුකමක් නැති, නැත්නම් යම්කිසි රෝගයකින් පෙළෙන දරුවන් ප්‍රමාණයක්. හැබැයි ඒ අය හඳුනා ගන්නට වැඩ පිළිවෙළක් යොදමුයි කියන ඒ විශාල දැවැන්ත කටයුත්ත තමයි මේ අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාව තුළ තියෙන්නේ. ඒකෙන් අදහස් වන්නේ නැහැ, මේ දුප්පත් දරුවන් විශාල ප්‍රමාණයක් පාසල් පද්ධතියේ ඉන්නවා. ඒ නිසා ඒ අයට වැඩක් කරමුයි කියලා. හැබැයි, මේ පාසල් දුප්පත්ද, පොහොසත් ද කියන එක නොවෙයි. මගේ කථාව අවසන් කරන්නට පෙර කියන්න කැමැතියි පොහොසත් පාසල්වල දරුවෝත් ඕනෑතරම් ඉන්නවා සපත්තු කුට්ටමක් ගන්න බැරි. Royal එකේ ගත්තාම එහෙත් ඉන්නවා. Royal එකට එන්නේ ඔක්කෝම මුදල් තියෙන අය නොවෙයි. Royal එක මගේ ආසනයට එහා පැත්තේ. අර කොල්ලුපිටියේ මුහන්දිරම් පාරේ දරුවත් ගන්නවා. Royal එක ඉස්සරහ හැටේ වත්තේ දරුවත් ගන්නවා. පැල්පත් දරුවාත් ගන්නවා. ඒ පැල්පත් දරුවාගේ අම්මා තාත්තට සපත්තු දෙක අරගෙන දෙන්න හැකියාවක් නැහැ. අර Royal එකේ දැවැන්ත ආර්ථික හැකියාවක් තියෙන දෙමව්පියෝ එක්ක ගැටෙන්නට අර දරුවාට හැකියාවක් නැහැ. මෙතුමා අදහස් කරන්නේ, මේ සමස්ත දරු පරපුර සඳහා වැඩක් කරමුයි කියන එකයි. ඒ නිසා මෙවැනි කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව - මොකද, මේ යෝජනාව ගෙනෙන කොටම එක්සත් ජාතික පක්ෂය හොඳට දත කට මැද ගෙන හිටියා විවේචනය කරන්න පසුබිමක් අපට හදලා දෙනවයි කියලා. අම්ජාඩ් මන්ත්‍රීතුමා මේක වුවමනාවෙන්ම තමයි ගෙනාවේ. මොකද හේතුව -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඔබතුමා අපට විරුද්ධ වෙන්නද කියන්නේ?

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

කවුද?

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඔබතුමාගේ කථාවෙන් -

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

නැහැ. විරුද්ධ වුණා නේ දැන්. සිරිකමල් මන්ත්‍රීතුමා කථා කරලා ගියේ . හරි ඔබතුමා හොඳ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මම දන්නවා ඔබතුමා –

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

ඔබතුමා කියන්නේ අපට විරුද්ධ වෙන්න කියලද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාලා සංවාදයේ යෙදෙන්න එපා. මූලාසනයට කථා කරන්න.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතන්නේ අපේ ජ්‍යෙෂ්ටම මන්ත්‍රීතුමා කියන නිසා, එතුමා මේ යෝජනාවට සහයෝගය ලබා දෙනවා කියන නිසා, තවත් මේ ගැන මම කථා කරන්නේ නැහැ. අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපගේ එකඟත්වය පළ කරමින් මා හිතන්නේ, ලංකා ඉතිහාසයේ අයවැයකින් පාසල් පද්ධතිය සඳහා දැවැන්ත මුදල් ප්‍රමාණයක් වෙන් කළ අතිගරු ජනාධිපතිතුමාට බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.19 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි. මම හිතන්නේ මේ යෝජනාව අපේ අම්ජාඩ් මන්ත්‍රීතුමා ගෙනාපු එකක්ද? නැත්නම් කථා කරපු මන්ත්‍රීතුමා ගෙනාපු එකක්ද කියලා මට හිතාගන්න බැහැ. එහෙම් නැත්නම් අම්ජාඩ් මන්ත්‍රීතුමා වෙනුවෙන් එතුමා කථා කළාද කියලා හිතාගන්නත් බැරුවයි මම ඉන්නේ. (බාධා කිරීම්)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් මෙතුමා ප්‍රකාශ කළා, මේ සංවර්ධනය ගැන. එක නිල ඇඳුමක් දුන්න ළමයින්ට දැන් නිල ඇඳුම් දෙකක් දෙනවයි කිව්වා. එහෙම නැත්නම් ජනාධිපතිතුමා සපත්තු කුට්ටමක් නැතුව දරුවෙක් දැකලා දැන් ඔක්කෝටම සපත්තු කුට්ටම් දෙනවයි කිව්වා. මෙකෙන් පැහැදිලි වන්නේ මොකක්ද? මේ අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තව කොටසක තියෙනවා. පවුල්වල ආර්ථික පීඩනය ගැන. මේකෙන් පැහැදිලි වන්නේ අද මේ රටේ ජනතාව කොපමණ දුප්පත් වෙලාද? කොපමණ අසරණ වෙලාද?

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ලංකාවේ විතරක් නොවෙයි ඇමරිකාවේත් තියෙනවා ආර්ථික පීඩනය. ඒක කවදාවත් වෙනස් කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඇමරිකාව ගැන නොවෙයි නේ කථා කරන්නේ. මේ යෝජනාවේ තියෙන්නේ ඇමරිකාව ගැනද? නැහැ නේ? ශ්‍රී ලංකාව ගැන. ඉතින් පොඩ්ඩක් අහගන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඒක විකෘති කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ අද ආර්ථික තත්ත්වය ගැනමයි පැහැදිලි කරන්නේ. එකක් දුන්නු තැනට අද දෙකක් දෙන්න වෙලා තියෙනවා. සපත්තු අවශ්‍ය නැති කෙනාට අද සපත්තු දෙන්න වෙලා තියෙනවා. මොකද? මේ රටේ ආර්ථිකය ඒ තරම්ම වැටිලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙන්න එපා කියලද කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙකක් නොවෙයි. ඊළඟට තුන හතරක් දෙන්න වෙයි තව සුමානයක් දෙකක් යන කොට. මෙතුමාලා කිව්වා, රට සංවර්ධනය කරන්න ණය ගන්න ඕනෑය කියලා. ණය ගන්න ඕනෑ. ණය ගන්නේ නැතුව රටක් සංවර්ධනය කරන්න බැහැ. නමුත් ණය ගන්න ඕනෑ රටට ඒ ණය දරන්න පුළුවන් ප්‍රමාණයෙන්. ණය ගන්න ඕනෑ චීනයෙන් 7% යි, 8% යි පොළියට නොවෙයි. ණය ගන්න ඕනෑ, 1% ට දෙන ලෝක බැංකුවෙන්. එහෙම තමයි ණය අරන් රටක් සංවර්ධනය කරන්නේ. තමුන්නාන්සේලා කරන්නේ, රට සංවර්ධනය කරන එක නොවෙයි. මීට ඉස්සෙල්ලා කිව්වා මන්ත්‍රීවරුන්වත්, ජනාධිපතිතුමාවත්, ඇමතිවරුන්වත් සාක්කුවේ දාගන්නේ නැහැයි කියලා. නමුත් අද අපි හොඳටම දන්නවා, 1% පොළියට තියෙද්දි 7% ට, 8% ගන්නේ මොකටද කියලා. (බාධා කිරීම්) ඔය පාරවල් හදද්දි තමුන්නාන්සේලාගේ සාක්කුවටත් ගානක් යනවා ඇති. එහෙමත් වෙනවා ඇති. අපි දන්නවා.

රට සංවර්ධනය ගැන කථා කළා. අද මූලාසනයේ ඉන්න ලංකාතිලක මන්ත්‍රීතුමිය සංවර්ධනය ගැන කථා කළා. මහවැලිය ගැන කථා කළා. අපි 8%, 9% පොළියට සල්ලි අරගෙනද මහවැලිය හැදුවේ? ඔබතුමිය මටත් වැඩිය ජ්‍යෙෂ්ඨ කෙනෙක්. මටත් වඩා දීර්ඝ කාලයක් දේශපාලනයේ හිටපු කෙනෙක්.

ඔබතුමියත් දැනගන්න ඕනෑ මම හිතන්නේ. මහවැලිය හැදුවේ කොහොමද කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

දන්නවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමියත් දන්නවා. මහවැලිය හැදුවේ කෝටි ප්‍රකෝටි ගණන් ණයට අරගෙන නොවෙයි. මහවැලිය හැදුවේ වැඩිපුරම බ්‍රිතාන්‍යයෙන් දුන්න තෑග්ගක් හැටියට. එහෙම තමයි මහවැලිය හැදුවේ අපි. තමුන්නාන්සේලා චීනයෙන් 7% ට, කෝටි ප්‍රකෝටි ගණන් ණය අරගෙන හම්බන්තොට වරායක් හදලා තියෙනවා. අද මේ රටේ ජනතාවට ඒකෙන් තියෙන ප්‍රයෝජනය මොකක්ද? ඊයේ පෙරේදා ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 150 කින් වැඩි වුණා. මොකටද මේ 150 කින් වැඩි වෙන්නේ? ලෝක වෙළඳ පොලේ ගෑස් මිල වැඩි වුණ නිසාද? නැහැ. ඔය ගත්තු ණයෙන් බොරු වැඩ කරලා. තවත් ගුවන් තොටුපොලවල් හදනවාලු. මොනවටද? තියෙන ගුවන් තොටුපොල තවම –

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතන්නේ මෙතුමා කථා කරන්නේ –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තවත් ඒවා හදනවා. මොනවටද? මේවාවලින් හොඳට ගහන්න පුළුවන්, සාක්කුවට. තමුන්නාන්සේලා කියන ඇමතිගොල්ලන්ට, මන්ත්‍රීගොල්ලන්ට ඔය උඩ ඉන්න කට්ටියට. මම නම කිව්වොත් දාන්නෙත් නැහැ නේ? ඒ නිසා –

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

ගුවන් තොටුපොලක් හදන එක ගැන සංතෝෂ වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි සංතෝෂ වෙනවා, තියෙන ගුවන් තොටුපොල තව ටිකක් සංවර්ධනය කළා නම්. මේ රටට, අපට තවත් ගුවන් තොටුපොලවල් අවශ්‍ය නැහැ.

**ගරු දයාකාන්ත පෙරේරා**
Hon. Dayakantha Perera

2001 ඉඳන්-

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු දයාකාන්ත මන්ත්‍රීතුමා, එතුමාට කථා කරන්න දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කෙටියෙන් කියන්න හදන්නේ. අම්ජාඩ් මන්ත්‍රීතුමා අද මේ ආණ්ඩුවේ තියෙන පාලනය තුළින් කෙතරම් දුරට නාස්තිය, දූෂණය, වංචාව වෙනවාද කියන එක තමයි මේ කියන්නේ. නොහැකියාව ගැන තමයි මේ කියන්නේ. වෙන කිසිම දෙයක් ගැන නොවෙයි මේ කථා කරන්නේ. දැන් ඔබතුමිය දන්නවා නේ? දැන් ඔබතුමියට මම කිව්වොත්. මේවා කිසිම දෙයක් දෙන්න ඕනෑ නැහැ. මොකද, මේ රටේ ජනතාවගේ අතේ සල්ලි තියෙනවා නම්. රට දියුණු වෙලා තියෙනවා නම්. ජනතාව දියුණු වෙලා තියෙනවා නම්. රටේ සංවර්ධන ව්‍යාපෘතිවලින් ජනතාවගේ අතට සල්ලි එනවා. නමුත් මේවා දෙන්න ඕනෑය කියන්නේ, මේ කිසි දෙයක් වෙලා නැති නිසා. එහෙනම් මෙපමණ කල් ඔබතුමාලා කරලා තියෙන්නේ, පොල් ගාපු එකයි. තමුන්නාන්සේලාගේ රජය පොල් තමයි ගාලා තියෙන්නේ. (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය ඉවරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජනතාවට පොල් කුඩු ටිකවත් ඉතුරු කරලා නැහැ, මෙතුමාලා. ඒක තමයි වෙලා තියෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියනවා නම් මගේ කාලය ඉවරයි කියලා. තව ටිකක් ඔබතුමිය කියපු ඒවා ගැනත් මට කථා කරන්න තිබුණා. නමුත් කාලවේලාව නැති නිසා ඊළඟ ටිකට ඉතරු කරගන්නම්.

[ අ.භා. 12.25 ]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මුලින්ම ස්තූතිවන්ත වෙනවා 2013 වසරේ දී ගරු අම්ජාඩ් මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙන යෝජනාවට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන. එතුමා මේ යෝජනාව ගෙනැල්ලා තියෙන්නේ, මේ රටේ තිබෙන වැදගත්ම ප්‍රශ්නය වන අධ්‍යාපන ක්‍රමය අපේ දරුවන්ට ලබා දීමෙන් අපේ රට අගාධයට යනවා නම්, ඒ රට අගාධයෙන් ගොඩ ගන්න එකම ක්‍රමය තමයි අධ්‍යාපනය දියුණු කිරීම. ඒ නිසා තමයි රටක් විදියට, බස්නාහිර පළාත් සභාවක් විදියට, අපේ ගරු ප්‍රධාන ඇමතිතුමා යම්කිසි දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් හදලා දැනට අවුරුදු තුනක කාලය තුළ මේ පාසල් පද්ධතියේ

විශාල දියුණුවක් ඇති කරලා තියෙන්නේ. අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ බස්නාහිර පළාත් සභාවේ පාසල් දිහා බැලුවාම පාසල් භෞතික වශයෙනුත්, ඒ වාගේම අනෙකුත් මානව සම්පත් අතිනුත් විශාල ප්‍රගතියක් ලබලා තියෙනවා. ඒ විතරක් නොවෙයි. ගිය අවුරුද්දේ විභාග ප්‍රතිඵල දිහා බැලුවාම පහේ ශිෂ්‍යත්ව ප්‍රතිඵල, අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල, අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල දිහා බැලුවාම අධ්‍යාපනය අතින් කවදාවත් නොවුණු දියුණුවක් ලබලා තියෙනවා.

ඒ වාගේම අපේ පාසල්වල පරිසරය අලංකාර කිරීමට, දරුවාගේ මනස පරිසරය කෙරෙහි යොමු කිරීමට විශාල මුදලක් වැය කරලා තියෙනවා. ඒ නිසා මම හිතනවා. අධ්‍යාපනය තුළින් විශාල වැඩ කොටසක් කරලා තියෙන මේ මොහොතේ ගරු අම්ජාඩ් මන්ත්‍රීතුමා ගෙනැවිත් තියෙන යෝජනාව - මෙය අද ඊයේ නොවෙයි. රජ කාලේ - රජවරු හිටිය කාලයේ වුවත්, මේ රටේ අසරණ මිනිස්සු හිටියා. මේ රට ස්වයංපෝෂිතයි කියන කොයි යුගයේ වුණත් අසරණ මිනිස්සු හිටියා. ඒ අයට අපි පිහිට වුණා. ඒ අයට ඇති හැකි අය පිහිට වුණා. ඒ නිසා මේ යෝජනාව ගෙනැවිත් තියෙන්නේ, මේ රට බංකොලොත් කියලාවත්, එහෙම නැත්නම් අධ්‍යාපනය කඩා වැටිලා කියලාවත් නොවෙයි. පාසල් නොයන ළමයි, අධ්‍යාපනය නොලබන ළමයි, අධ්‍යාපනයේ නොයෙදන ළමයි ගැන වෙනම අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු යටතේ වෙනම අය පත් කරලා තියෙනවා ඒ අයව අධ්‍යාපනයට යොමු කරන්න. ඒ අයට අකුරු කියවන්න, ලියන්න බැරි නම්, මේ අධ්‍යාපන ක්‍රමය අනුව ඒ අයට වෙනම පන්ති පවත්වලා අධ්‍යාපනය ලබා දෙන්න මග සලස්වලා තියෙනවා.

ඒ එක්කම මෙම අධ්‍යාපන ක්‍රමය අනුව ඒ ළමයි පාසලට පැමිණෙන කොට අවුරුදු 14 ක් දක්වා ළමයෙකුට පාසල් නොගිහින් ඉන්න බැහැ. ඒ ළමයා ගෙදර තියා ගත්තොත් අම්මා තාත්තා වුණත් වැරදියි. අවුරුදු 14 ක් වෙන කල් ළමයෙකුව වැඩකට යොදවන්න බැහැ. රැකියාවකට යන්න බැහැ. ඒ නිසා එහෙම යුගයක තමයි අද අපි මේ යෝජනාව ගෙනැල්ලා තියෙන්නේ. එහෙම යුගයක් තිබුණා. පහුගිය වකවානුවල අධිරාජ්‍යවාදී යුගයේ, ධනපතීන්ගේ යුගයේ, ධනපතියන්ගේ ගෙවල්වල වැඩකාරකම්වලට, ඒ අයගේ වතුපිටිවල වැඩවලට මේ අහිංසක ළමයින්ව යොදවා ගත්තා. ඒ නිසා ඒ අයට අධ්‍යාපනය දෙන්න ක්‍රමයක් ලැබුණේ නැහැ. ඒ අය හැමදාම ධනපතියන්ගේ ගැත්තෝ බවට පත් වුණා. අධ්‍යාපන ක්‍රමයක් තිබුණේ නැහැ. නමුත් අද නව ක්‍රමයක් අනුව අධ්‍යාපනය නොලබන ළමයි ඉන්නවා නම්, ඒ දෙමව්පියන්ට විරුද්ධව නඩු දාලා හරි අධ්‍යාපන ක්ෂේත්‍රයට ගේන්න ක්‍රමයක් රජයෙන් හදලා තියෙනවා. ඒ නිසා අද ඒක දැඩි ලෙස ක්‍රියාත්මක වෙනවා. එහෙම වෙන කොට ගමේ ඉන්න දිළිඳුම පවුලක, එහෙම නැත්නම් ගමේ ඉන්න දුප්පත්ම පවුලක ළමයින්ට වුණත් ඉස්කෝලේ නොගිහින් ඉන්න බැහැ. ඒ අය එන්න ඕනෑ ඉස්කෝලෙට. ඒ නිසා අද ඒ ළමයි ඉස්කෝලෙට ආවාම ඒ ළමයින්ට සපත්තු දෙකක් අරගෙන දෙන්න, ඒ ළමයින්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න අර අහිංසක දෙමව්පියන්ට බැහැ. ඒ වාගේම නොයෙකුත් ඉස්කෝලවලත් ඒ අයගෙන් පාසල් සංවර්ධන සමිතියට අය කරන්න පුළුවන් මාසෙකට රුපියල් තුනයි. මාසෙකට රුපියල් තුනක් තමයි ළමයෙකුගෙන් අයකරන්න පුළුවන්. නමුත් පාසල් සංවර්ධන සමිතිවලින් නොයෙකුත් නීති දාගෙන වැඩිපුර සල්ලි ඒ ළමයින්ගෙන් ගන්නවා.

ඒ වාගේම School Fees ගෙවන්න පුළුවන් අවුරුද්දකට රුපියල් 60/- යි. ඊට වඩා කාගෙන්වත් ගන්න බැහැ. ඒ නිසා මේ රුපියල් 60 ක් කියන එක ලොකු මුදලක් නොවෙයි. ඒ නිසා මේ වෙලා තියෙන්නේ, අර වාගේ දුප්පත් පවුල්වල ළමයි ඉස්කෝලේ යන්නේ නැතුව තැන් තැන්වල හිඟමනේ යෙදුන ළමයින්ව අද අධ්‍යාපනයට යොමු කළාම ඒ ළමයින්ව අධ්‍යාපනය ලබන්න ඉස්කෝලවලට ආවාම ඒ ළමයිත්, අර ළමයින්වත් අතර වෙනසක් පේනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාවෙන් අපි ඉල්ලා සිටින්නේ, තෝරාගත් සුළු පිරිසකට විතරක් බස්නාහිර පළාත් සභාවෙන් මුළු රටටම ආදර්ශයක් විධියට ඒ අහිංසක අයව දෙපයින් නගා සිටුවන්න, කොන්ද කෙලින් සිට ගෙන නැගී සිටින්න පුළුවන් විධියේ වාතාවරණයක් හදලා ඒ අයට අවශ්‍ය මුදල්, අවශ්‍ය ප්‍රතිපාදන ශිෂ්‍යත්වයක් මාර්ගයෙන් - මාසෙකට මෙපමණයි, අවුරුද්දකට මෙපමණයි කියලා ගණනක් වෙන් කරලා ඉස්කෝලෙකට - ළමයි දොදහක් ඉන්න ඉස්කෝලෙකට ඕනෑ නම් සියයකට දෙසීයකට ගෙවන්න වෙයි මේ ක්‍රමය අනුව. එහෙම දෙයක් කරලා ඒ ළමයින්ව මානසිකත්වයෙන් උඩට ගේන්න තමයි මේ අලුත් යෝජනාව ගෙනැත් තියෙන්නේ. එහෙම නැතුව මේ රට බංකොලොත්. රටේ සල්ලි නැහැ. මිනිස්සු දුක් විඳිනවා. එහෙම දෙයක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද ළමයි ඉස්කෝලේ ගෙනියන්නේ රුපියල් 50, 100, 200. අපට ඉස්සර ඉස්කෝලේ ගෙනියන්න දුන්නේ, සත පහයි. දහයයි. අද ළමයි එහෙමයි ඉස්කෝලවල යන්නේ. එහෙම හිඟයක් නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉල්ලා සිටිනවා. කරුණාකර මේ යෝජනාව හොඳයි. මෙය යෝජනාවක් විධියට විතරක් නොවෙයි. මෙය ක්‍රියාත්මක කරන්න. ඒ අය කාගේවත් බැල මෙහෙවරකම් කරන අය බවට පත් කරන්න එපා. කාගෙවත් පස්සෙන් යන අය බවට පත් කරන්න එපා. දුප්පත් ළමයි අපේ ගෙවල්වලට සමහර වෙලාවට එනවා, පොත් List එකක් අර ගෙන. අනේ මහත්තයෝ, මේ පොත ලිස්ට් එක ගන්න සල්ලි දෙන්න. ළමයා ඉස්කෝලේ යවන්න බැහැ කියලා. ඒ තත්ත්වයන් උදා කරන්න එපා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවෙන් අහිංසක දරුවන් සංගණනයක් කරලා දුප්පත් ළමයින්ව තෝරා ගෙන ඒ අයට කාටවත් අත නොපා අධ්‍යාපන අමාත්‍යාංශයෙන්ම අවශ්‍ය මුදල් ඒ අවුරුද්දේ අන්තිමට ලැබෙන්න දෙනවා නම් - ඒ පවුලට,

එහෙම නැත්නම් පංති භාර ගුරුවරයාට ලබා දීලා අවශ්‍ය විධියේ උපකරණ, එහෙම නැත්නම් අවශ්‍ය දේවල් ලබා දෙන්න සලස්වන්න කියලා ඉල්ලා සිටිමින් මට අවස්ථාව ලබා දීම ගැන ඉතාමත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.31 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ අවස්ථාවේදී සංතෝෂ වෙනවා. අද මේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් සම්බන්ධයෙන්. ඇත්තෙන්ම මම මේ යෝජනාව ඉදිරිපත් කළේ, අද රටේ පවත්නා අභිංසක දූ දරුවන් වෙනුවෙන්. බස්නාහිර පළාත් සභාව ආදර්ශයක් කර ගනිමින් අපි මේ දරුවන් වෙනුවෙන් යම්කිසි සහනයක්, යහපතක් ලබා දීමේ චේතනාවෙන්. මම ඉතාමත්ම කනගාටුවට පත් වෙනවා. මේ අභිංසක දූ දරුවන් වෙනුවෙන් ඒ අභිංසක දූ දරුවන්ගේ නෙත් යොමු කරන්නට කටයුතු කරන මේ මොහොතේදී විපක්ෂය මේ යෝජනාව තමන්ගේ පැත්තට වාසි සහගත වන විධියට හරවා ගැනීමට උත්සාහ කිරීමේ පහත් ක්‍රියාව මම මේ අවස්ථාවේ දැඩි පිළිකුල් සහගතව මතක් කරන්න කැමතියි. අපි කිසිම අවස්ථාවක, කිසිම මොහොතක රජයක් වශයෙන් කියන්නේ නැහැ, සියයට සියයක්ම දූප්පත්කම තුරන් කරන්න පුළුවන් කියලා. අපට එහෙම කියන්න බැහැ. ඒක දෙවියන්ටත් කරන්න බැරි වැඩක්. දෙවියන් වහන්සේ මේ රට පාලනය කළත්. මේක කවදාක්වත් කරන්න බැරි දෙයක්. අපි පිළිගන්නවා. බස්නාහිර පළාත තුළ අද මේ වන කොට දිළිඳු භාවය 8.9% දක්වා අඩු කරලා තියෙනවා එහෙම නම් ඒ 8.9% දිළිඳු ජනතාව වෙනුවෙන් ඒ පවුල්වල ළමයින් සඳහා යම්කිසි ශිෂ්‍යත්ව ක්‍රමවේදයක් සකස් කිරීමට තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. මෙතැන්දී කිසිම අවස්ථාවක එක්සත් ජාතික පක්ෂය හෝ වේවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ වේවා. ජනතා විමුක්ති පෙරමුණ හෝ වේවා. පක්ෂයක් විපක්ෂයක් නැතුව ඔබේම අභිංසක දූ දරුවන් වෙනුවෙන් අභිංසක දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්, ඒ අභිංසක දූ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම වෙනුවෙන්, ඔවුන්ට හොඳ අනාගතයක් ලබා දීම වෙනුවෙන්, ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම වෙනුවෙන්, ඔවුන්ගේ ඒ සැඟවුනු සහජ කුසලතාවයන් සමාජයට ඉස්මතු කිරීමේ දිරිය ශක්තිය ලබා දීම වෙනුවෙන් අපි සමාජයෙන් ඉටු කළ යුතු කාර්ය භාරය පෙන්වා දීම තමයි මේ යෝජනාවෙන් අපි බලාපොරොත්තු වුණේ.

[ ගරු එම්.එම්.එම්. අම්ජාඩ් ]

ඒ නිසා ඒ සඳහා මේ විවාදයට සහභාගි වුණු පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නැවත වතාවක් ස්තුති කරනවා. මම හිතන්නේ මේ යෝජනාව ඉතාමත්ම හොඳ යෝජනාවක් වශයෙන් බස්නාහිර පළාත් සභාව තුළින් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට සියලු මන්ත්‍රීවරුන්ගේ - අඩුම ගණනේ තමන්ට හිමි ප්‍රතිපාදනවලින් කැපවීමක් කරලා මුල්ම වසරේ ක්‍රියාත්මක කරන්න කියන එක මතක් කරමින්, ඒ හැකියාව තුළ මේ අභිංසක දූ දරුවන්ව සමාජයේ හොඳ පරපුරක් බවට නිර්මාණය කිරීමට, සමාජය තුළ හොඳ මෙහෙවරක් කිරීමට හැකියාව ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් පරපුරක් බිහි කිරීමට ශක්තිය ධෛර්යය ලබා දෙන්න කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි මම යෝජනා කරනවා.*"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.36 ට, 2013 ජනවාරි මස 22 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.36 p..m till 09.30 a.m, on 22.01.2013.*